# ගුරු මාර්ගෝපදේශය
# බුද්ධ ධර්මය

(2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

## 1 ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# ගුරු මාර්ගෝපදේශය

# බුද්ධ ධර්මය

## (2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

1 ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

බුද්ධ ධර්මය
1 ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය - 2026

©ජාතික අධ්‍යාපන ආයතනය
ප්‍රකාශනය : ජාතික අධ්‍යාපන ආයතනය
ISBN

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.ac.lk

# ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පරිවර්තනීය ප්‍රතිසංස්කරණ ප්‍රයත්නය සෑම ඉගෙනුම් ලාභියෙකුගේ ම අවශ්‍යතා සපුරාලීම සඳහා තීරණාත්මක මාවතක් අරමුණු කර ඇත.

නිපුණතා පාදක ඉගෙනුම, විචාරාත්මක චින්තනය, නිර්මාණශීලීත්වය, විසි එක් වන සියවසේ කුසලතා, තාක්ෂණික නැඹුරුව, සදාචාරාත්මක පුරවැසි භාවය වැනි බොහෝ අංශ අවධාරණය කිරීමට හැකි වන පරිදි විෂයමාලාව, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම සහ තක්සේරු පිළිවෙත් යනාදිය නවීකරණය මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි පදනම විය.

අධ්‍යාපනඥයින්, අන්තර්වෛෂයික විද්වතුන්, ගුරුවරුන් සහ විවිධ පාර්ශ්වකරුවන් සමග සහයෝගි සංවාදයක් ඔස්සේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජිත විෂයමාලා හා අදාළ ඉගෙනුම් ද්‍රව්‍යවල ගුණාත්මක භාවය සහතික කිරීම සඳහා විශේෂ උනන්දුවක් ගෙන කටයුතු කළ ගරු අග්‍රාමාත්‍යතුමිය, අධ්‍යාපන ලේකම්තුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්, විෂය භාර නිලධාරීන්, විභාග කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය අති මහත් ය.

එමෙන්ම මෙම කාර්යයේදී විශේෂ කැපවීමක් සිදු කළ ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක සභාවේ හා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ කැපවීම ද ගෞරව පූර්වක ස්තුතියෙන් සිහිපත් කරමි. මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීමට ඉමහත් ලෙස කැප වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලු කාර්ය මණ්ඩලයට ජාතියේ ගෞරවය හිමි විය යුතු බව සඳහන් කරමි.

මහාචාර්ය මංජුලා විතානපතිරණ
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

සමස්ත පාසල් විෂයමාලාව සඳහා හඳුනා ගෙන ඇති පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර නිරන්තරයෙන් වෙනස් වන රටක සහ ලෝකයක තිරසර සංවර්ධනය කෙරෙහි වන අභියෝග ජය ගැනීමට එම ජාතියට ඇති හැකියාව පිළිබිඹු කරයි. එමෙන්ම කලින් කලට වෙනස් වන ඉල්ලුම්වලට ගැළපෙන සේ පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර ද හඳුනා ගෙන ඇත. එසේ ම පවතින පාසල් විෂයමාලාවෙහි විෂයයන් නවීකරණය වන අතර ම නව විෂයයන් පාසල් විෂයමාලාවට හඳුන්වා දීම සිදු කරයි. මෙම සිදු වන වෙනස්කම්වලට අනුරූප ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ද කාලානුරූප ව සංවර්ධනය වෙයි. ඒ අනුව 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව විෂයමාලාවට අදාළ ව සැම පාසල් විෂයයක් සඳහා ම ඉගෙනුම් ද්‍රව්‍ය හඳුන්වා දී ඇත.

2026 වර්ෂයේදී 1 ශ්‍රේණිය සඳහාත් 2027 වර්ෂයේදී 2 ශ්‍රේණිය සඳහාත් 2028 වර්ෂයේදී 3 ශ්‍රේණිය සඳහාත් 2029 වර්ෂයේදී 4 ශ්‍රේණිය සඳහාත් 2030 වර්ෂයේදී 5 ශ්‍රේණිය සඳහාත් ප්‍රාථමික අධ්‍යාපන ශ්‍රේණි සඳහා නව විෂයමාලා හඳුන්වා දීමට නියමිත ය. ප්‍රාථමික අධ්‍යාපන අවධියේ සිසුන් සඳහා ක්‍රියාකාරකම් පොත් සකස් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය මග පෙන්වීම ගුරුවරයාගෙන් සිදු කෙරෙයි. ගුරුවරුන්ට ලබා දෙන උපදෙස් ගුරු මාර්ගෝපදේශවල ඇතුළත් කර ඇති අතර සිසුන්ට අවශ්‍ය සංකල්ප පිළිබඳ දැනුම මෙන් ම ලබා ගත් දැනුම භාවිත අවස්ථාවලට යොමු කර සිසු හැකියා සංවර්ධනයට මෙම විෂයමාලාව බෙහෙවින් උපකාර වන බව අපගේ විශ්වාසයයි. විසි එක්වන සියවසේ කුසලතා සංවර්ධනයටත් එමගින් සිසු පෞරුෂය සංවර්ධනයටත් හඳුන්වා දෙනු ලබන විෂයමාලාවේ ඇතුළත් ක්‍රියාකාරකම් මනා පිටුබලයක් වනු ඇත.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට මූලික කටයුතු කළ අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරුන්ගේ හා ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ සේවාව ඉතා අගය කරමි. තව ද මෙම විෂයමාලා ද්‍රව්‍ය සකස් කිරීමේදී දායක වූ ආයතනයේ සියලු ම කාර්ය මණ්ඩලයට ද ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, අධ්‍යක්ෂවරුන් මෙන් ම රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලබා දෙන ලද දායකත්වය මෙම ඉගෙනුම් ද්‍රව්‍ය ගුණාත්මක ව ඉහළ මට්ටමකට සංවර්ධනය වීමට ඉවහල් වූ බව ඉතා සතුටින් සිහිපත් කරමි.

ආචාර්ය එස්. ඒ. ඩී. සමරවීර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

**උපදේශකත්වය**

**මහාචාර්ය, මංජුලා විතානපතිරණ**
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය.

**ආචාර්ය, දර්ශන සමරවීර**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය.

**පූජ්‍ය උඩුගම සුදස්සි ස්වාමින් වහන්සේ**
අධ්‍යක්ෂ, ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය

**අධීක්‍ෂණය**

**ආර්. එම්. කුමුදුමලී ද සිල්වා**
අධ්‍යක්‍ෂ, මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.ද

**විෂය සම්බන්ධීකරණය**

**කේ. ආර්. එම්. සකුන්තලා රණසිංහ**, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

**ලේඛක මණ්ඩලය**

**ආචාර්ය දමන සුගතධම්ම ස්වාමීන් වහන්සේ,** ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, මීරිගම.
**ආචාර්ය ටී. චන්ද්‍රිකා පීරිස්**, කථිකාචාර්ය
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.
**වයි. ඒ.ඩී. ගර්ටි විජේරත්න,**
ගුරු උපදේශිකා, ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය
**ආර්. එච්. දීපිකා පෙරේරා,**
ගුරු සේවය, බප/ජය/ධර්මාශෝක කනිටු විදුහල, මහරගම

**භාෂා සංස්කරණය**

**ඩබ්ලිව්. කරුණාරත්න**
ජ්‍යෙෂ්ඨ කාථිකාචාර්ය, ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය, ගිරාගම.

**පිටකවරය හා චිත්‍ර නිර්මාණය**

**කේ. ඒ. සමන් කළුබෝවිල**
කථිකාචාර්ය, හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, මීරිගම.

**පරිගණක අක්ෂර සංයෝජනය**

**ආර්. එම්. රජිත සම්පත්**
ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

## අන්තර්ගතය

### 1 වාරය


01. අපේ බුදුහාමුදුරුවෝ 01

02. තෙරුවන් සරණ යමු 01

03. අපි පන්සල් යමු 05

04. අපූරු සිහිනය 11

05. සිරිමත් උපත 11

06. මව්පිය ආශීර්වාද ලබමු 14

07. ගුරු උතුමන් නමදිමු 14

08. දන් දී අපි පින් පුරමු 18

09. පුංචි සිතක සතිමත්බව 21


### 2 වාරය


01. පුංචි සිතයි සිල් සුවඳයි 24

02. රාහුල පොඩි හාමුදුරුවෝ 26

03. මිහිරි වචන කතා කරමු 28

04. සම්බුදු තෙමගුල සමරමු 30

05. සාදු සාදු පෙරහර යමු 32

06. පුංචි අපේ මල් දන්සල 34

07. දිනපතා තෙරුවන් නමදිමු 36


### 3 වාරය


01. මහා කාරුණික බුදු සමිඳු 39

02. මල්වියන් බැඳි සුමන මල්කරු 41

03. ගී ගයමු යහ ගුණ උගනිමු 43

04. පන්තිය ලස්සන කරමු 45

05. ඇති පමණට නෙළා ගනිමු 47

06. සුව දෙන දින චරියාව 49

07. පුංචි අපිත් මෙත් වඩමු 51

# ආගම් හා සාරධර්ම අධ්‍යාපනය - ප්‍රාථමික අධ්‍යාපනය

**1.0 හැඳින්වීම**

සංස්කෘතික වශයෙන් විවිධ වූ සමාජයක ආගම ඉගැන්වීම සංවේදී කාරණයකි. විවිධ ආගම්වල දාර්ශනික හා ප්‍රායෝගික අංශවල විවිධ වෙනස්කම් තිබේ. එබැවින් ප්‍රධාන වශයෙන් ඔවුන්ගේ ම ආයතනික සැකැස්ම තුළ විවිධ ආගමික ක්‍රියාකාරකම් හේතුවෙන් ඔවුන්ව තනි වේදිකාවකට ගෙන ඒම අපහසු ය. ජාතික ආර්ථිකයට, සංවර්ධනයට සහ සංහිඳියාවට ද එය අහිතකර අයුරින් බලපා ඇත. වෙනස් ප්‍රවේශයකින් කටයුතු කිරීම ජාතික අවශ්‍යතාවක් ව පවතී. ඒ අනුව, ආගම් සහ සාරධර්ම අධ්‍යාපනය සඳහා වූ ජාතික විෂයමාලා රාමුවේ ප්‍රධාන අරමුණ වන්නේ ජාතික අධ්‍යාපනයට ආගම් සහ සාරධර්ම අධ්‍යාපනය උපකාර වන ආකාරය පෙන්වීම යි.

ආගම් සහ සාරධර්ම අධ්‍යාපනයේ අවසාන අරමුණ වන්නේ දරුවෙකුගේ වයසට සරිලන පරිදි ආගමික අධ්‍යාපනයක් ලබා දීම යි. කුමන ආගමකට අයත් වුව ද හිස, හදවත, අත, මනස සමග සමපාත වන පරිදි ආකල්ප සංවර්ධනය කිරීම තුළින් අනාගත ලෝකය ජයගත හැකි විනයගරුක නිර්මාණශීලී පුද්ගලයකු සමාජයට දායාද කිරීම අවශ්‍යය වේ.

ප්‍රධාන සමාජ-ආගමික සංකල්ප පහක් යටතේ ගොඩනගා ඇති මෙම ආගම් සහ සාරධර්ම අධ්‍යාපනය සඳහා වන විෂයමාලා රාමුවෙන් ආධ්‍යාත්මික සංවර්ධනයට මෙන් ම පුද්ගල සංවර්ධනයට ද අවශ්‍ය මූලික කුසලතා ගොඩනැඟීම අපේක්ෂා කෙරේ. ඒ අනුව මෙම විෂයමාලා රාමුවෙන් බලාපොරොත්තු වන්නේ අනාගත අභියෝගවලට උද්යෝගයෙන් සහ ධෛර්ය සම්පන්න ව මුහුණ දිය හැකි කාර්යක්ෂම නව්‍ය පුද්ගලයන් සමාජයට දායාද කිරීම සඳහා අවශ්‍ය පදනම ප්‍රාථමික අධ්‍යාපනයේ සිට ම ගොඩනැඟීමයි.

ප්‍රාථමික අධ්‍යාපනය සඳහා බුද්ධ ධර්මය විෂය නිර්දේශ සැකසීමේදී අදාළ ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන්ගේ වයස් මට්ටම, පරිණතිය, භාෂා හැකියා, රුචිකත්ව හා ළැදියා කෙරෙහි සැලැකිලිමත් වී තිබේ. අදාළ ඉගෙනුම් පල අත්පත් කර ගැනීම සඳහා ප්‍රායෝගික ජීවිතයේදී අද්දැකීම් ලද හැකි ආකාරයේ ක්‍රියාකාරකම්වල නිරතවීමට අවස්ථා සම්පාදනය කර දී ඇත

> කුඩා දරුවකුට බුද්ධ ධර්මය විෂය ඉගැන්වීම අතිශය වගකීමක් සහිත ව කළ යුත්තකි. කුඩා අවධියේ ඉතා සුළු වූ හෝ කරුණක් සම්බන්ධයෙන් වැරදි වැටහීමක් ඇති වුව හොත් එය එම දරුවාගේ මෙලොව ජීවිතයට පමණක් නොව පරලොව ජීවිතයට ද බලපෑමට ඉඩ ඇත. එබැවින් නොදන්නා හෝ සැකමුසු හෝ කරුණු ඇතොත් ඒ සියල්ල මැනැවින් දැන ගෙන නිවැරදි දේ ම ඉදිරිපත් කිරීමට සියලු ගුරුවරුන් අනතිමානී විය යුතුවාක් මෙන් ම පුරෝගාමී විය යුතු ය.

සිසුන්ගේ ජීවිතවලට ආදර්ශයක් වන පරිදි තමා ද යහපත් ජීවන පැවැත්මෙන් යුතු ව මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම ගුරුවරුන්ගේ වගකීම යි. සෑම ගුරුවරයකු විසින් ම නම්‍ය කාල සටහනක් ක්‍රියාත්මක කිරීම මගින් සිසුන්ට වඩාත් හිතකර ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගත හැකි ය.

### 1.1 ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

ප්‍රාථමික ශ්‍රේණිවල බුදු දහම ඉගැන්වීමේදී කුඩා දරුවන් ප්‍රිය කරන ආගමික ජීවිතය හා සමීප ක්‍රියාකාරකම් බහුල ලෙස යොදා ගත යුතු වේ. වන්දනා, ආගමික චාරිකා, විහාර මන්දිර නැරඹීම්, වත්පිළිවෙත් මේ අතර ප්‍රධාන තැනක් ගනියි. තව ද ජාතක කතා, චරිත කතා, ශාසන ඉතිහාසය හා සම්බන්ධ කතා රසවත් ව ඉදිරිපත් කළ යුතු ය.

මේ හා සම්බන්ධ ගායනා, රංගන, චිත්‍ර ඇඳීම වැනි සෞන්දර්ය මුසු ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවීමට ද නිරන්තරයෙන් අවධානය යොමු කළ යුතු ය. එවිට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය වින්දනයක් ගෙන දෙන ඉතා ම සුන්දර අද්දැකීමක් වෙමින් බුද්ධ ධර්මය ඉගෙනීමේ දැඩි ආශාවක් සිසුන් තුළ ඇති වනු නොඅනුමාන ය.

### 1.2 පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

පාසල් සංස්කෘතිය හා සම්බන්ධ වැඩසටහන්වලින් බුද්ධ ධර්මය විෂයට අදාළ සංකල්ප බොහොමයක් ගොඩනැගිය හැකි ය. පාසල් සංස්කෘතිය තුළ මෙම සංකල්ප ගොඩනැඟෙන නව අංග නිර්මාණය කෙරෙහි විදුහල්පතිවරුන්ගේ සුවිශේෂ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ. ප්‍රාථමික පාසල සඳහා ක්‍රියාත්මක වන උදෑසන ආගමික වැඩසටහන් මේ අතර ප්‍රධාන තැනක් ගනියි. මෙම වැඩසටහන පළමුවන ශ්‍රේණියේදී ඉතා සරල ව අරඹා පස්වන ශ්‍රේණිය තෙක් ක්‍රමයෙන් දියුණු කරමින් විවිධ අංග එක් කළ හැකි ය.

ගුරුවරයා විසින් තම සිසුන් වාරයකට එක් වතාවක් හෝ විහාරස්ථානයට රැගෙන යා යුතු ය. එහිදී කෙරෙන වතාවත් ඇසුරින් සිසුන් තුළ ශ්‍රද්ධාව ජනිත වෙයි. මෙම ක්‍රියාකාරකම් මගින් ගිහි - පැවිදි සම්බන්ධතාව ද වර්ධනය වී යහපත් සමාජයක් බිහි වීමට එය ද හේතුපාදක වනු ඇත.

පුද්ගල පවිත්‍රතාව, විනීතබව, කරුණාව, දයාව, ආශීර්වාද ඇසුරෙන් ගොඩනැඟෙන සමානාත්මතාව, සුහදත්වය, සහයෝගය ආදි ලක්ෂණවලින් පාසල් සංස්කෘතිය පෝෂණය වී ඇත. එවැනි සංස්කෘතියක් තුළ ආගම් හා සාරධර්ම විෂයයෙන් අපේක්ෂිත අත්‍යවශ්‍ය ඉගෙනුම් සංකල්ප තහවුරු කිරීම ඉතා පහසු වේ. එවැනි වාතාවරණයක් ඇති කල්හි විෂය තුළින් ඉගෙන ගන්නා සියල්ල ප්‍රායෝගික භාවිතයට ද අවස්ථා උදා වේ.

### 1.3 තක්සේරු කිරීම

ප්‍රාථමික ශ්‍රේණිවලදී ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ ලිඛිත පරීක්ෂණ වැනි ඇගයීම්වලට වඩා ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරු කර ගත් ඇගයීම්වලට ය. නිරීක්ෂණය, ගවේෂණය, ක්ෂේත්‍ර චාරිකා, අභිනය, නාට්‍ය, රූකඩ, සාකච්ඡා, වාචික ප්‍රශ්න ඇසීමෙන් සිසුන් තක්සේරු කළ හැකි ය.

තම පාසලේ පවතින මානව හා භෞතික සම්පත් මෙන් ම පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් මත වඩාත් සුදුසු අවස්ථා හා ඵලදායී ක්‍රමවේද තක්සේරුකරණය සඳහා යොදා ගැනීමට අවධානය යොමු කිරීම වැදගත් ය.

උගත් විෂය කරුණු අනුව සිසු දැනුම, අවබෝධය, භාවිත හැකියාව මෙන් ම යහපත් ආකල්ප හා යහ පුරුදු සංවර්ධන වන ආකාරය තක්සේරු කිරීමට ගුරුවරයා නිර්මාණශීලී ව හා උපක්‍රමශීලී ව විෂය අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස තක්සේරුකරණ ක්‍රම යොදා ගත යුතුය. ඒ සඳහා ගුරුවරයාට නම්‍යශීලී ක්‍රමවේද සුදුසු පරිදි භාවිත කිරීමට හැකිය.

සිසු සාධන මට්ටමට අදාළ නිර්ණායක තක්සේරු කිරීම සඳහා කේවල මෙන් ම කණ්ඩායම් වශයෙන් ද අවස්ථා සම්පාදනය කර ගැනීමට ගුරුවරයාට හැකියාව පවතී.

මෙහි ඇතුළත් සමහර නිර්ණායක තක්සේරු කිරීම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී එක් කාලච්ඡේදයක දී පමණක් සිදු කිරීම අපහසු ය. එවැනි අවස්ථාවලදී වර්ෂය පුරා සිදු කෙරෙන තක්සේරු කිරීම් ද යොදා ගැනීම සුදුසු වේ.

### 2.0 පරමාර්ථය /අරමුණ


තිරසාර සාම සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීම සඳහා පුළුල් අවබෝධයක් ඇති විවිධත්වයට ගරු කරන චිත්තවේගීය ව සමතුලිත, ප්‍රජාතන්ත්‍රවාදී සහ විනයගරුක ගෝලීය පුරවැසියකු නිර්මාණය කිරීම

### 3.0 අභිමතාර්ථ

1. දැහැමි, විනයගරුක සහ චිත්තවේගීය වශයෙන් සමතුලිත වූ පුරවැසියන් බිහි කිරීම
2. මානව වටිනාකම් මත පදනම් වූ විවිධ චාරිත්‍ර වාරිත්‍ර පිළිවෙත් සහ සම්මතයන් අගය කිරීම
3. අප අවට ඇති වෙනස්කම් තාර්කික ව පිළිගනිමින් සහ ගරු කරමින් සමාජ සහජීවනය ශක්තිමත් කිරීම
4. අභ්‍යන්තර සාමය සහ ආධ්‍යාත්මික සතුට භුක්ති විඳීම සහ බෙදා ගැනීම
5. පුද්ගල සහ විවිධ සමාජ අතර සෞඛ්‍ය සම්පන්න සබඳතා ප්‍රවර්ධනය කිරීම
6. සමාජ-සංස්කෘතික සහ පාරිසරික සංවේදිතාවන්ට දායක වෙමින් අභියෝග සමග ධනාත්මක ලෙස කටයුතු කිරීමකටයුතු කිරීම

4.0 බුද්ධ ධර්මය විෂයයේ අත්‍යවශ්‍ය මූලික සංකල්ප

මෙම බුද්ධ ධර්මය විෂය අන්තර්ගතය සංවිධානය කර ඇත්තේ ආගම් හා සාරධර්ම විෂයයට අදාළ ව හඳුන්වා දී ඇති පහත දැක්වෙන අත්‍යවශ්‍ය මූලික සංකල්ප පහ පදනම් කරගෙන ය.




4.1 මූලික සංකල්ප

1. චරිත සංවර්ධනය
2. සමාජීය හා සංස්කෘතික සංවේදිතාව
3. ආචාරධර්ම, සාරධර්ම හා සම්මතයන්
4. පාරිසරික සංවේදිතාව
5. සතිමත්බව, සෞඛ්‍යය හා යහපැවැත්ම

4.2 මූලික සංකල්පවලට අදාළ ක්‍රියාකාරී නිර්වචන

| සංකල්පය | නිර්වචනය |
|---|---|
| චරිත සංවර්ධනය | ඕනෑ ම අභියෝගයක් ජය ගැනීමේ හැකියාවකින් යුතු ධනාත්මක ආකල්ප පෝෂණය කිරීම මෙන් ම ශාරීරික, මානසික, සමාජීය හා චිත්තවේගීය වශයෙන් මනා පෞරුෂයකින් යුතු පුද්ගලයෙකුගේ පදනම සැකසීම. |
| සමාජීය හා සංස්කෘතික සංවේදිතාව | ආගම් හා සංස්කෘතික භේදයෙන් තොර ව සැම දෙනා සමග ම සුහදශීලීත්වයෙන් හා දැනුවත්බවෙන්, අවබෝධයෙන්, පිළිගැනීමෙන් මෙන් ම වෙනස් සමාජ සංස්කෘතික පසුබිම් පිළිබඳ සංවේදී වෙමින් කටයුතු කිරීමේ හැකියාව. |
| ආචාරධර්ම, සාරධර්ම හා සම්මතයන් | තිරසර සමාජ යහපැවැත්මකට අත්‍යවශ්‍ය වන පිළිගත් සමාජ, සංස්කෘතික හා ආගමික වටිනාකම්, ප්‍රතිපත්ති, ආචාරධර්ම, සාරධර්ම හා සම්මත ඇසුරෙන් ජීවිතය හැඩගස්වා ගැනීම. |
| පාරිසරික සංවේදිතාව | පාරිසරික සංවේදීතාව මගින් පුද්ගලයෙකුට ඔවුන්ගේ පරිසරය පිළිබඳ තොරතුරු අවබෝධ කර ගැනීමට සහ සැකසීමට ඇති හැකියාව විස්තර කෙරේ. එය සැම ආගමික දර්ශනයක ම පාහේ දක්නට ලැබෙන මූලික ලක්ෂණයකි. එය තීරණාත්මක සාධකයක් වන්නේ එය පුද්ගලයෙකුට විවිධ පාරිසරික තත්ත්වයන්ට අනුවර්තනය වීමට ඉඩ සලසන බැවිනි. |
| සතිමත්බව, සෞඛ්‍යය හා යහපැවැත්ම | ශාරීරික හා මානසික සමබරතාව පවත්වා ගනිමින් ආතතියකින් තොර ව නිරෝග ජීවිතයක් සඳහා නිරන්තරයෙන් යහපත් සිහිය පවත්වා ගැනීම. |

5.0 එක් එක් සංකල්පයට අදාළ ව ප්‍රාථමික අවධිය සඳහා විස්තර වාක්‍ය

| අත්‍යවශ්‍ය මූලික සංකල්ප | විස්තර වාක්‍ය (Level Descriptors) |
|---|---|
| | ප්‍රාථමික අවධිය |
| චරිත සංවර්ධනය | ප්‍රාථමික අවධිය අවසානයේ ශිෂ්‍යයාට,<br>■ ගුරුවරුන්ගේ හා වැඩිහිටියන්ගේ මග පෙන්වීම යටතේ 'ආගම' යන සංකල්පය හඳුනා ගනිමින් සිය චරිතය හා හැසිරීම් නිවැරදි ව හැඩගස්වනු ලබන සරල ආගමික ක්‍රියාකාරකම්වල නියැළීමට |
| සමාජීය හා සංස්කෘතික සංවේදිතාව | ■ තමා ජීවත් වන බහු ආගමික වටපිටාව තුළ පවතින ආගම් මත පදනම් වූ උත්සව, ඇඳුම් පැලඳුම්, ආචාර සමාචාර ආදිය පිළිබඳ අද්දැකීම් ලබමින් සංස්කෘතික විවිධත්ව පිළිබඳ අවබෝධයෙන් යුතු ව සියලු දෙනා සමග සහයෝගයෙන් කටයුතු කිරීමට |
| ආචාරධර්ම, සාරධර්ම හා සම්මතයන් | ■ ආගමට අදාළ ව සිදු කරන වත්පිළිවෙත්, වන්දනාමාන හා භාවිත කරන සුවිශේෂ වචන පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කිරීමට<br>■ ආගමික ස්ථානවලට සුදුසු ඇඳුම් පැලඳුම් භාවිතයට හා නිවැරදි හැසිරීම් පවත්වා ගැනීමට<br>■ යහපත් දරුවකු ලෙස පිළිපැදිය යුතු යහපුරුදු, සිරිත්විරිත් අනුගමනය කරමින් අන්‍යයන් සමග සහයෝගයෙන් හා ගෞරවයෙන් කටයුතු කිරීමට |
| පාරිසරික සංවේදිතාව | ■ ජීවිතය පරිසරය සමග අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පවතින ආකාරය ආගම මගින් තේරුම් ගනිමින් පරිසරය කෙරෙහි සංවේදී ව කටයුතු කිරීමට |
| සතිමත්බව, සෞඛ්‍යය හා යහපැවැත්ම | ■ එදිනෙදා කාර්යයන් සතිමත් ව (Mindfully) කිරීමට පුරුදු පුහුණු වෙමින්, තම කටයුතු නිරවුල් ව හා ප්‍රීතිමත් ව සිදු කිරීමට<br>■ හිතකර දෛනික චර්යා රටාවක් සඳහා යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීමට<br>**හැකියාව ලැබේ.** |

## 6.0 ආගම් හා සාරධර්ම විෂයමාලා රාමුවට අනුව සකසන ලද 1 ශ්‍රේණිය - බුද්ධ ධර්මය විෂය නිර්දේශය

| සංකල්පය | ඉගෙනුම් පල | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|
| චරිත සංවර්ධනය | 1. බුදු දහමට අදාළ මූලික ඇවතුම් පැවතුම්, වාග් මාලාව, සංකේත හා පාඨ ඇසුරින් බුදු දහම පිළිබඳ සංකල්පය හඳුනා ගෙන ප්‍රදර්ශනය කරයි. | 1.1 සංකේතාත්මක ව බුදුරජාණන්වහන්සේ හඳුනා ගෙන වන්දනා කරයි. | 1.1.1 නිවැරදි ව හඳුනා ගෙන වන්දනා කිරීම |
| | | 1.2 බුදු දහමට අදාළ මූලික සංකේත හඳුනා ගෙන නම් කරයි. | 1.2.1 නිවැරදි ව හඳුනා ගෙන නම් කිරීම |
| | | 1.3 බුදු දහමට සුවිශේෂ වූ වදන් උචිත අවස්ථාවන්හි දී භාවිත කරයි. | 1.3.1 නිවැරදි ව සුවිශේෂ ආගමිකවදන් හඳුනා ගැනීම<br>1.3.2 උචිත අවස්ථාවන්හි දී භාවිත කිරීම |
| | | 1.4 බුදු දහමට සුවිශේෂ වූ අවස්ථාවන්වලට සහභාගී වී අද්දැකීම් ලබයි. | 1.4.1 සුදුසු පරිදි සැරසීම<br>1.4.2 සහභාගී වීම |
| | | 1.5 සැදැහැවත් ප්‍රකාශ ඉදිරිපත් කරයි. | 1.5.1 සැදැහැවත් ප්‍රකාශ ඉදිරිපත් කිරීම |
| | | 1.6 දහම් පාඨ හඳුනා ගෙන භාවිත කරයි. | 1.6.1 දහම් පාඨ නම් කිරීම<br>1.6.2 දහම් පාඨ අවස්ථානුකූල ව භාවිත කිරීම |
| | 2. බුද්ධ චරිතය / ජාතක කතා/උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග චරිතායනය කරයි. | 2.1 බුද්ධ චරිතය ආශ්‍රිත කතන්දර/ සිද්ධිවලට කැමැත්තෙන් සවන් දී ප්‍රතිචාර දක්වයි. | 2.1.1 අවධානයෙන් සවන් දීම<br>2.1.2 නිවැරදි ප්‍රතිචාර දැක්වීම |
| | | 2.2 බුද්ධ චරිතය ආශ්‍රිත විශේෂ සිදුවීම් ප්‍රකාශ කරයි. | 2.2.1 සිද්ධි විස්තර කිරීම<br>2.2.2 විශේෂ සිදුවීම් ප්‍රකාශ කිරීම |
| | | 2.3 ජාතක කතාවලට සවන් දී ප්‍රතිචාර දක්වයි. | 2.2.1 අවධානයෙන් සවන් දීම<br>2.3.1 නිවැරදි ප්‍රතිචාර දැක්වීම |
| | | 2.4 ආගමික කතන්දර ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.4.1 අවධානයෙන් සවන්දීම<br>2.4.2 ආදර්ශ ප්‍රකාශ කිරීම |
| | | 2.5 උපදේශ කාව්‍යකට සවන් දී තාලයට ගායනා කරයි. | 2.5.1 අවධානයෙන් සවන් දීම<br>2.5.2 තාලයට ගායනා කිරීම |
| | | 2.6 උපදේශ කාව්‍ය ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි | 2.6.1 ආදර්ශ ප්‍රකාශ කිරීම |
| සමාජීය හා සංස්කෘතික සංවේදිතාවය | 3. ආගමික සිද්ධස්ථාන හඳුනාගෙන එම ස්ථානවල දී ගෞරවාන්විත ව හැසිරෙයි. | 3.1 තම ආගමික ස්ථානය හඳුනාගෙන නම් කරයි. | 3.1.1 නිවැරදි ව හඳුනාගෙන නම් කිරීම |
| | | 3.2 ආගමික සිද්ධස්ථානවල දි ආගමානුකූල ව හැසිරෙයි. | 3.2.1 ආගමානුකූල හැසිරීම ප්‍රදර්ශනය කිරීම |
| | | 3.3 ආගමික සිද්ධස්ථානවල දි සුදුසු ඇඳුම, නිවැරදි කතාබහ භාවිත කරයි | 3.3.1 සුදුසු ඇඳුමෙන් සැරසීම<br>3.3.2 නිවැරදි කතාබහේ යෙදීම |

| | | | |
|---|---|---|---|
| | 4. ආගමික හෝ සංස්කෘතික උත්සව/ වැඩසටහන්වලට සහභාගී වී අද්දැකීම් ලබයි. | 4.1 සුවිශේෂ ආගමික හෝ සංස්කෘතික උත්සවයකට/ වැඩසටහනකට ක්‍රියාකාරී ව සහභාගී වෙයි. | 4.1.1 ක්‍රියාකාරී ව සහභාගී වීම<br>4.1.2 ක්‍රියාකාරකම්වල නිරත වීම |
| | | 4.2 සුවිශේෂ ආගමික හෝ සංස්කෘතික උත්සවයක් / වැඩසටහනක් ආදර්ශනය කරයි. | 4.2.1 අදහස් ප්‍රකාශ කිරීම<br>4.2.2 නිර්මාණශීලී බව ප්‍රදර්ශනය කිරීම<br>4.2.3 නිවැරදි ව උපකරණ භාවිත කිරීම<br>4.2.4 අවස්ථානුකූලව හැසිරීම<br>4.2.5 සුදුසු වදන් භාවිත කිරීම |
| **ආචාරධර්ම, සාරධර්ම හා සම්මතයන්** | 5. පූජනීය ස්ථානවලදී නිවැරදි වත් පිළිවෙත් හා සිරිත් විරිත් අනුගමනය කරයි. | 5.1 පූජනීය ස්ථානවලදී අනුගමනය කළ යුතු නිවැරදි වත් පිළිවෙත් හා සිරිත් විරිත් හඳුනා ගනියි. | 5.1.1 නිවැරදි වත් පිළිවෙත් ප්‍රකාශ කිරීම<br>5.1.2 නිවැරදි සිරිත්විරිත් ප්‍රකාශ කිරීම |
| | | 5.2 පූජනීය ස්ථානවලදී නිවැරදි වත් පිළිවෙත් හා සිරිත් විරිත්වලට අනුව කටයුතු කරයි. | 5.2.1 නිවැරදි ව වත් පිළිවෙත්වල යෙදීම<br>5.2.2 නිවැරදි සිරිත්විරිත් අනුග මනය කිරීම |
| | 6. ආගමික වතාවත්වල නිරතවීමේදී නිවැරදි වත් පිළිවෙත් සිරිත් විරිත් හා ඉරියවු ප්‍රදර්ශනය කරයි. | 6.1 ආගමික වතාවත්වල නිරතවීමේදී නිවැරදි වත් පිළිවෙත්වල යෙදෙයි. | 6.1.1 නිවැරදි වත් පිළිවෙත්වල යෙදීම |
| | | 6.2 ආගමික වතාවත්වල නිරතවීමේ දී නිවැරදි සිරිත්විරිත් අනුගමනය කරයි. | 6.2.1 නිවැරදි සිරිත් විරිත් අනු මනය කිරීම |
| | | 6.3 ආගමික වතාවත්වල නිරතවීමේ දී නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කරයි. | 6.3.1 නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කිරීම |
| | | 6.4 ආගමික කටයුතුවලදී අදාළ නිවැරදි වචන භාවිත කරයි. | 6.4.1 නිවැරදි වචන භාවිත කිරීම |
| | 7. යහපත් දරුවකු ලෙස පිළිපැදිය යුතු සිරිත් විරිත් / ගුණ ධර්ම අවබෝධයෙන් යුතුව අනුගමනය කරයි. | 7.1 ගුණ ධර්ම/සිරිත්විරිත් ඇතුළත් කතන්දරවලට සවන් දී ප්‍රතිචාර දක්වයි. | 7.1.1 කැමැත්තෙන් සවන් දීම<br>7.1.2 නිවැරදි ප්‍රතිචාර දැක්වීම<br>7.1.3 කතන්දර ගොඩනැගීම |
| | | 7.2 කතන්දර ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 7.2.1 ආදර්ශ ප්‍රකාශ කිරීම |
| | | 7.3 යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය යුතු නිවැරදි ගුණ ධර්ම/ සිරිත් විරිත් හඳුනා ගනියි. | 7.3.1 නිවැරදි ගුණ ධර්ම ප්‍රකාශ කිරීම<br>7.3.2 නිවැරදි ගුණ ධර්ම/ සිරිත් විරිත් අනුගමනය කිරීම |
| | | 7.4 යහපත් දරුවෙකු ලෙස කටයුතු කරයි. | 7.4.1 ප්‍රකාශ කිරීම<br>7.4.2 නිවැරදි හැසිරීම ප්‍රදර්ශනය කිරීම |

| | | | |
|---|---|---|---|
| **පාරිසරික සංවේදීතාවය** | 8. තමා අවට පරිසරය පිරිසිදුවට හා පිළිවෙළකට තබා ගැනීමට ක්‍රියා කරයි. | 8.1 තමා අවට පරිසරය පිරිසිදු කිරීමට දායක වෙයි. | 8.1.1 ක්‍රියාකාරී ව සහභාගී වීම |
| | | 8.2 අවට පරිසරය අලංකාර ව පිළිවෙළකට තබා ගැනීමට කටයුතු කරයි. | 8.2.1 අදහස් ප්‍රකාශ කිරීම<br>8.2.2 නිර්මාණශීලී බව ප්‍රදර්ශනය කිරීම<br>8.2.3 උපකරණ භාවිත කිරීම<br>8.2.4 අගය කිරීම |
| | 9. බුදුරජාණන් වහන්සේ සොබාදහමේ වටිනාකම ඉස්මතු කළ ආකාරය පිළිබඳ ව දැනුවත් වෙමින් ක්‍රියා කරයි. | 9.1 කතන්දර/කවි ඇසුරෙන් සොබාදහමේ වටිනාකම හඳුනා ගනියි. | 9.1.1 අවධානයෙන් සවන්දීම<br>9.1.2 අවබෝධයෙන් අදහස් ප්‍රකාශ කිරීම |
| | | 9.2 පරිසර සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කරයි. | 9.2.1 අරපිරිමැස්ම ප්‍රදර්ශනය කිරීම |
| | | 9.3 සතුන් කෙරෙහි සංවේදී බව ප්‍රකාශ කරයි. | 9.3.1 ආදරය දැක්වීම<br>9.3.2 වාචික ප්‍රකාශන ඉදිරිපත් කිරීම |
| | | 9.4 සතුන්ට ආහාර පාන ලබා දීමට ස්ථානයක් සකස් කරයි. | 9.4.1 සාමූහික ව ස්ථාන සකස් කිරීම |
| | | 9.5 අනුකම්පාවෙන් යුතු ව සතුන්ට ආහාරපාන ලබා දෙයි. | 9.5.1 ආහාර පාන ලබා දීම<br>9.5.2 ස්ථාන පිරිසිදු කිරීමට දායක වීම |
| **සතිමත්බව සෞඛ්‍යය හා යහපැවැත්ම** | 10. හිතකර දෛනික චර්යා රටාවක් සඳහා යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි. | 10.1 යහපත් දින චරියාවක අනුපිළිවෙළ ප්‍රකාශ කරයි. | 10.1.1 අනුපිළිවෙළ ප්‍රකාශ කිරීම |
| | | 10.2 යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි. | 10.2.1 යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම |
| | 11. දෛනික ක්‍රියාකාරකම්වලදී මනා සිහියෙන් යුතු ව කටයුතු කරයි. | 11.1 ඇවිදීමේදී මනා සිහියෙන් යුතුව ඇවිදියි. | 11.1.1 සිහියෙන් ඇවිදීම |
| | | 11.2 ඇවිදීමේදී යටි පතුලට දැනෙන රළු- සිනිඳු, තෙත- වියළි, උණුසුමසිසිල්බව හඳුනා ගනිමින් ඇවිදියි. | 11.2.1 අද්දැකීම් ප්‍රකාශ කිරීම |
| | | 11.3 සරල භාවනාවක (Meditation) යෙදෙයි. | 11.3.1 නිවැරදි ඉරියව්වෙන් අසුන් ගැනීම<br>11.3.2 භාවනා කිරීම |

# බුද්ධ ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

1 ශ්‍රේණිය

පළමු වාරය

## සංකල්පය - චරිත සංවර්ධනය
## 1 පාඩම - අපේ බුදුහාමුදුරුවෝ
## 2 පාඩම - තෙරුවන් සරණ යමු

තම ශාස්තෘවරයා හඳුන්වා දීමත්, බුදුරජාණන් වහන්සේ පිළිබඳ ශ්‍රද්ධාව ජනිත කරවීමත්, තෙරුවන් ගුණ සඳහන් පාඨ හඳුන්වා දීමත් මෙයින් අපේක්ෂිත ය.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 1.0 බුදු දහමට අදාළ මූලික ඇවතුම් පැවතුම්, වාග් මාලාව, සංකේත හා පාඨ ඇසුරින් බුදු දහම පිළිබඳ සංකල්පය හඳුනාගෙන ප්‍රදර්ශනය කරයි. | බුදුරජාණන් වහන්සේ<br>බුදු පිළිම වහන්සේ<br>බුදු ගුණ<br>තෙරුවන් | 1.1 සංකේතාත්මක ව බුදුරජාණන් වහන්සේ හඳුනා ගෙන වන්දනා කරයි. | 1.1.1 නිවැරදි ව හඳුනා ගෙන වන්දනා කිරීම. |
| | | 1.2 බුදු දහමට අදාළ මූලික සංකේත හඳුනා ගෙන නම් කරයි. | 1.2.1 නිවැරදි ව හඳුනා ගෙන නම් කිරීම. |
| | දහම් වදන්<br>දහම් පාඨ<br>දහම් ප්‍රකාශ | 1.3 බුදු දහමට සුවිශේෂ වූ වදන් උචිත අවස්ථාවන්හිදී භාවිත කරයි. | 1.3.1 නිවැරදි ව සුවිශේෂ දහම් වදන් හඳුනා ගැනීම.<br>1.3.2 උචිත අවස්ථාවන්හි දී භාවිත කිරීම. |
| | | 1.5 සැදැහැවත් ප්‍රකාශ ඉදිරිපත් කරයි. | 1.5.1 සැදැහැවත් ප්‍රකාශ ඉදිරිපත් කිරීම. |

**ඉගෙනුම් සම්පත් :**

- බුදුරජාණන් වහන්සේගේ පින්තූරයක් (සිසුන්ගේ ක්‍රියාකාරකම් පොතේ ඇත.)
- පැනක් හා මිහිරි නාදයක් ලැබෙන බඳුනක්
- නව අරහාදි බුදු ගුණ පාඨය (හඬ පටයක් තිබේ නම් වඩාත් සුදුසු ය.)

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම 1**

1 පාඩම - අපේ බුදුහාමුදුරුවෝ

පියවර 1 -

- මිහිරි නාදයක් ලබා ගත හැකි බඳුනක් සපයා ගන්න.
- පළමු ව පැනෙන් හෝ සුදුසු ක්‍රමයකින් බඳුනට තට්ටු කරන්න.
- සියලු සිසුන්ගේ අවධානය එම මිහිරි නාදය වෙත රඳවා ගන්න. (මෙයින් පන්ති කාමරයේ සිටින සියලු සිසුන් නිශ්ශබ්ද කරවා ගෙන අවධානය ගුරුතුමා/ තුමිය වෙත යොමු කර රඳවා ගත හැකි ය.)
- හඬ කෙරෙහි අවධානය යොමු කරන ක්‍රියාකාරකම සිදු කරන ආකාරය පිළිබඳ සිසුන්ට පහදා දෙන්න.
  * හොඳින් වාඩි වෙන්න.
  * ඇස් පියා ගන්න.
  * හොඳින් හුස්ම ගන්න. (තුන් වතාවක් පමණ)

* පළමු ව හඬ හොඳින් අසන්න.
* නැවත හඬ ඇසෙන විට ඇස් අරින්න.
* නැවත ඇස් පියා ගන්න.
* හඬ ඇසෙන විට ඇස් අරින්න.
* මෙලෙස කිහිප වරක් සිසුන් සියලු දෙනාගේ ම අවධානය ක්‍රියාකාරකමට යොමු කරවන්න.

- බුද්ධ ධර්මය ක්‍රියාකාරකම් පොතේ පළමු පාඩම පෙරළා ගන්නට සැම දෙනාට ම අවස්ථාව දෙන්න
- නැවත හඬ ඇසෙන්නට සලස්වන්න. දෑස් පියා ගන්නට කියන්න.
- හඬ ඇසෙන්නට සලස්වා ඇස් ඇරුණු පසු ව සිසුන්ට ක්‍රියාකාරකම් පොතේ පළමු පාඩමේ ඇති බුදුරජාණන් වහන්සේගේ පින්තූරය දෙස හොඳින් බලන්නට අවස්ථාව දෙන්න.
- බුදුරජාණන් වහන්සේගේ පින්තූරය දෙස බලන විට පින්තූරයේ දුටු දේ සිසුන්ගෙන් අහන්න.

* ලස්සන මුහුණක් ඇති බව
* දිගු කන් පෙති උරහිස දක්වා එල්ලී තිබෙන බව
* උඩට රවුම් වූ කෙස් ඇති බව
* හිස වටා බුදු රැස් විහිදෙන බව
* නළලේ ලස්සන සංකේතයක් ඇති බව
* දෙඇස් ඇර ගෙන අප දෙස බලා සිටින බව
* සිවුරක් ඇඳ සිටින බව
* වමත දකුණු පා යටිපතුල උඩ තබාගෙන සිටින බව
* දකුණු අතෙන් ආශීර්වාද කරන බව
* වාඩි වී සිටින ආසනයේ අලංකාරය ආදී වශයෙන් සියුම් නිරීක්ෂණයක් තුළින් බුද්ධ පින්තූරයෙන් සිසුන් දකින දේ වාචික ව ලබා ගන්න.

- නැවත බඳුනට තට්ටු කර ශබ්දය ඇසුණු පසුව දෑස් පියා ගෙන බුදුරජාණන් වහන්සේගේ රුව සිතෙන් මවා ගන්නට යොමු කරන්න. බුදුරජාණන් වහන්සේ කොයි  වගේ ද? කොහොම කෙනෙක් ද? ආදිය ගැන සිතන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙලෙස විනාඩි දෙකක් පමණ බුදුරජාණන් වහන්සේ ගැන ම සිතමින් බුදුරුව සිතින් මවා ගෙන සිටින්නට අවස්ථාව දෙන්න.
- නැවත නාදය නිකුත් කර පන්ති කාමරයේ සිටින සියලු සිසුන්ට නැවත දෑස් අරින්නට කියන්න.
- දැන් තමන්ට සිතුන දේ පවසන්නට සිසුන්ව පොලඹවන්න.
- එක් එක් සිසුන් පැවසූ දේ ගොනු කර ගෙන ඒ අනුව අපේ බුදුරජාණන් වහන්සේ පිළිබඳ සැදැහැවත් කෙටි ප්‍රකාශ කිහිපයක් සකසා ගන්න. උදාඃ
    - අපේ ආගමික ශාස්තෘවරයා වන්නේ බුදුරජාණන්වහන්සේ යි.
    - බුදුරජාණන් වහන්සේ ලස්සනයි.
    - බුදුරජාණන් වහන්සේ අපට ආදරෙයි.
    - බුදුරජාණන් වහන්සේ  කරුණාවන්තයි.
    - බුදුරජාණන් වහන්සේ සතුන්ට ආදරෙයි, කවදාවත් සතුන්ට හිංසා කළේ නැහැ.
- සිසුන් විසින් කරන ලද එම ප්‍රකාශ කිහිප වරක් සිසුන් සමග කියන්න.
- පුරුද්දක් වශයෙන් දිනපතා ආගමික වතාවත් සිදු කරන අවස්ථාවේදී මෙම ප්‍රකාශ සිසුන් සමග කියන්න

- බුදුරජාණන් වහන්සේගේ ගුණ හඳුන්වා දෙමින් ඒවා ආදර්ශයට ගත යුතු බව සිසුන්ට අවධාරණය කරන්න.

පියවර 2

- සිසුන් විසින් පවසන ලද ප්‍රකාශ ද ඇසුරු කර ගනිමින් එසේ හඳුනා ගත් බුදුරජාණන්වහන්සේට නිවැරදි ව දොහොත් මුදුන් තබා වන්දනා කරන ආකාරය ගුරුවරයා විසින් ආදර්ශනය කරන්න.
- නව අරහාදි බුදුගුණ පාඨය අසන්නට සලස්වන්න.
- නිවැරදි ව දොහොත් මුදුන් තබා බුදුරජාණන් වහන්සේට වන්දනා කරන්නට සිසුන් යොමු කරන්න.
- ගුරුතුමිය සමග එක් ව නව අරහාදි බුදුගුණ පාඨය කියමින් නිවැරදි ව දොහොත් මුදුන් තබා බුදුරජාණන් වහන්සේට වන්දනා කරන්නට යොමු කරන්න. (සහකියවීමට යොමු වන්න.)
- කණ්ඩායම් වශයෙන් හෝ සමූහ වශයෙන් මෙය සිදු කරන්න. **(හැකියාවක් පවතින්නේ නම් පාසලේ බුදු මැදුර ළඟට ගෙන ගොස් මෙම ක්‍රියාකාරකම කළ හැකි ය.)**

**ක්‍රියාකාරකම 2**

**2 පාඩම - තෙරුවන් සරණ යමු.**

**පියවර 1 -**

- ක්‍රියාකාරකම් පොතේ 2 පාඩම ඇසුරෙන් තෙරුවන් පිළිබඳ සිසුන්ට කියා දෙන්න.
- නව අරහාදි බුදු ගුණ පාඨය, ස්වාක්ඛාත පාඨය හා සුපටිපන්න පාඨය සජ්ඣායනය කරමින් නිවැරදි ඉරියවුවල පිහිටා ගුරුතුමිය සමග එක් වී තෙරුවන් වන්දනා කරන්න.
- බුදු සරණයි! තෙරුවන් සරණයි! වැනි බෞද්ධ ආශීර්වාදාත්මක වදන් භාවිත කළ හැකි අවස්ථා සිසුන්ට කියා දෙන්න.
- පන්ති කාමරයේ මෙන් ම දෛනික කටයුතුවලදී බෞද්ධ ආශීර්වාදාත්මක වදන් භාවිත කරන්නට සිසුන් යොමු කරවන්න.

## තක්සේරු කිරීම

| කාර්යසාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවයට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| | | මට්ටම 2 | මට්ටම 1 |
| 1.1 සංකේතාත්මක ව බුදුරජාණන් වහන්සේ හඳුනා ගෙන වන්දනා කරයි. | 1.1.1 | නව අරහාදී බුදු ගුණ පාඨය සජ්ඣායනය කරමින් නිවැරදි ව දොහොත් මුදුන් තබා වන්දනා කරයි. | නව අරහාදී බුදු ගුණ පාඨය සජ්ඣායනය කරමින් නිවැරදි ව දොහොත් මුදුන් තබා වන්දනා කිරීමෙහි දුෂ්කරතා පෙන්වයි. |
| 1.2 බුදු දහමට අදාළ මූලික සංකේත හඳුනා ගෙන නම් කරයි. | 1.2.1 | තෙරුවන් නිවැරදි ව (බුද්ධ රත්නය, ධර්ම රත්නය, සංඝ රත්නය) පිළිවෙළින් නම් කරයි. | තෙරුවන් පිළිවෙළින් නම් කිරීමට දුෂ්කරතා දක්වයි. |
| 1.5 සැදැහැවත් ප්‍රකාශ ඉදිරිපත් කරයි. | 1.5.1 | බුදුරජාණන් වහන්සේ පිළිබඳ සැදැහැවත් ප්‍රකාශ තම වචනයෙන් පවසයි. | බුදුරජාණන් වහන්සේ පිළිබඳ සැදැහැවත් ප්‍රකාශ පැවසීමට දුෂ්කරතා පෙන්වයි. |
| 1.3 බුදු දහමට සුවිශේෂ වූ වදන් උචිත අවස්ථාවන්හි දී භාවිත කරයි. | 1.3.1<br>1.3.2 | පන්ති කාමරයේදී අවස්ථානුකූලව බෞද්ධ ආශීර්වාදාත්මක වදන් භාවිත කරයි. | බෞද්ධ ආශීර්වාදාත්මක වදන් භාවිතයට උනන්දුවක් නොදක්වයි. |

## සංකල්ප - සමාජයීය හා සංස්කෘතික සංවේදීතාවය
## ආචාරධර්ම, සාරධර්ම හා සම්මත
## 3 පාඩම - අපි පන්සල් යමු

පන්සල් යාමට අවස්ථාව ලබා දෙමින් තම ආගමික ස්ථානය හඳුනා ගැනීමටත් පන්සල් යාමට පෙර කළ යුතු වත් පිළිවෙත් කුඩා කාලයේ සිට ම ක්‍රමානුකූල ව නිවැරදි ව කිරීමට යොමු කිරීමත්. පන්සලට ඇතුළු වීමට පෙර සහ පසුව කළ යුතු බොදු සිරිත් අනුගමනය කරමින් සිසුන් වන්දනාවෙහි නිරත කරවීමත් මෙහි අරමුණු වේ.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 3.0 ආගමික සිද්ධස්ථාන හඳුනා ගෙන එම ස්ථානවලදී ගෞරවාන්විත ව හැසිරෙයි. | පන්සල් යාම<br>ත්‍රිවිධ චෛත්‍ය<br>සුදුසු ඇඳුම<br>අල්ප ශබ්දතාව | 3.1 තම ආගමික ස්ථානය හඳුනා ගෙන නම් කරයි. | 3.1.1 නිවැරදි ව හඳුනා ගෙන නම් කිරීම |
| | | 3.2 ආගමික සිද්ධස්ථානවලදී ආගමානුකූලව හැසිරෙයි. | 3.2.1 ආගමානුකූල හැසිරීම ප්‍රදර්ශනය කිරීම |
| | | 3.3 ආගමික සිද්ධස්ථානවලදී සුදුසු ඇඳුම, නිවැරදි කතාබහ භාවිත කරයි. | 3.3.1 සුදුසු ඇඳුමෙන් සැරසීම<br>3.3.2 නිවැරදි කතාබහේ යෙදීම |
| 5.0 පූජනීය ස්ථානවලදී නිවැරදි වත් පිළිවෙත් හා සිරිත් විරිත් අනුව කටයුතු කරයි. | වත් පිළිවෙත්<br>සිරිත්විරිත් | 5.2 පූජනීය ස්ථානවලදී නිවැරදි වත් පිළිවෙත් හා සිරිත් විරිත් වලට අනුව කටයුතු කරයි. | 5.2.1 නිවැරදි ව වත් පිළිවෙත්වල යෙදීම<br>5.2.2 නිවැරදි සිරිත්විරිත් අනුගමනය කිරීම |
| 6.0 ආගමික වතාවත්වල නිරත වීමේදී නිවැරදි වත් පිළිවෙත්, සිරිත් විරිත් හා ඉරියව් ප්‍රදර්ශනය කරයි. | වත් පිළිවෙත් සිරිත් විරිත්<br>නිවැරදි ඉරියව්<br>ශාසනික වචන | 6.1 ආගමික වතාවත්වල නිරතවීමේ දී නිවැරදි වත් පිළිවෙත් යෙදෙයි | 6.1.1 නිවැරදි වත් පිළිවෙත්වල යෙදීම |
| | | 6.2 ආගමික වතාවත්වල නිරත වීමේ දී නිවැරදි සිරිත්විරිත් අනුගමනය කරයි. | 6.2.1 නිවැරදි සිරිත් විරිත් අනුගමනය කිරීම |
| | | 6.3 ආගමික වතාවත්වල නිරතවීමේ දී නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කරයි. | 6.3.1 නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කිරීම |
| | | 6.4 ආගමික කටයුතුවලදී අදාළ නිවැරදි වචන භාවිත කරයි. | 6.4.1 නිවැරදි වචන භාවිත කිරීම |

**ඉගෙනුම් සම්පත් :**

- පන්සල් ගෙන යාමට අවශ්‍ය ද්‍රව්‍ය
- පාසලේ උදෑසන ආගමික වතාවත් සිදු කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ඃ**

**ක්‍රියාකාරකම - 1 - (කාලය සුදුසු පරිදි යොදා ගන්න.)**


**3 පාඩම - අපි පන්සල් යමු**

**පියවර 1 ඃ පන්සල් යාමට පෙර සූදානම**

- විදුහල්පතිතුමා/තුමිය සමග සාකච්ඡා කර විහාරස්ථානයට යන ගමන සංවිධානය කර ගන්න.
- විහාරස්ථානයට දරුවන් රැගෙන ඒම පිළිබඳ ව පන්සලේ ස්වාමීන් වහන්සේ දැනුම්වත් කර අවසර ලබා ගන්න.
- ජාතික ඇඳුමෙන්/සුදු ළමා සාරියෙන් සැරසී පැමිණීමට සිසු සිසුවියන්ට උපදෙස් දී ඒ පිළිබඳ දෙමාපියන් ද දැනුම්වත් කරන්න.
- තෙල්, මල්, පහන් තිර, හඳුන්කූරු ආදි අවශ්‍ය පූජා භාණ්ඩ සූදානම් කර ගන්න.
- විහාරස්ථානයට යාමට පෙර දිනයේ පන්සලේදී හැසිරිය යුතු ආකාරය (අල්ප ශබ්දතාව රැකීම) ගැන දැනුම්වත් කරන්න.
- හැකි අයුරින් ස්වාමින් වහන්සේට පූජා කිරීමට සුදුසු පරිදි පිරිකර සූදානම් කර ගන්න.
- සුදුසු ආකාරයකට විහාරස්ථානයට පිටත්ව යන්න.

**පියවර 2 ඃ පන්සලට ඇතුළු වූ පසු**

- විහාරස්ථානයට ඇතුළු වන ස්ථානයේදී හිස් වැසුම්, පාවහන් ගලවා ඇතුළු විය යුතු බව පහදා දෙන්න.
- ගැලවූ පාවහන් පිළිවෙළට තැබීම
- මළු, මං පෙත් ඇමදීම හා මල් අසුන් පිරිසිදු කිරීම
- අත් දොහොන් කර ගැනීම හා මල් ධෝවනය කළ යුතු බව කියා දෙන්න.
- සැම විට ම ගුරුතුමිය/තුමා සිසුන්ට ආදර්ශයක් වන පරිදි එම කටයුතු සිදු කරන්න.
- පන්සල් භූමිය තුළ නිශ්ශබ්දතාව රැකීම පාසලේදී මතක් කර දුන් පරිදි ම කළ යුතු බව දරුවන්ට පහදා දෙන්න. (එක් විහාරස්ථානයකට දරුවන් 40කින් යුත් පන්තියක් පමණක් රැගෙන යාමෙන් අවශ්‍ය ඉගෙනුම් පල කරා ළඟා විය හැකි වේ.)
- පිළිවෙළින් චෛත්‍ය රාජයාණන් වහන්සේට, බෝධි රාජයාණන් වහන්සේට හා බුදුපිළිම වහන්සේට පහන්, සුවඳ දුම්, මල් ආදිය පූජා කරන්න. එය ත්‍රිවිධ චෛත්‍ය වන්දනාවේ පිළිවෙළ බව කියා දෙන්න.
- දකුණු අත චෛත්‍ය රාජයාණන් වහන්සේ/බෝධි රාජයාණන් වහන්සේ දෙසට තිබෙන සේ (දක්ෂිණාවර්තව) ප්‍රදක්ෂිණා කරමින් වන්දනාවේ යෙදීමට යොමු කරන්න.
- පන්සිල් සමාදන් වීමට පෙර දොහොත් මුදුනේ තබා නමස්කාර පාඨය කියන ආකාරය ගුරුතුමිය/තුමා ආදර්ශනය කර පෙන්වන්න. වන්දනාවෙහිදී වාඩිවිය යුතු ඉරියවු ද හඳුන්වා දෙන්න. (ගැහැනු ළමුන් අර්ධ පර්යංකය හා පිරිමි ළමුන් බද්ධ පර්යංකය)



- ත්‍රිවිධ චෛත්‍ය රාජයාණන් වහන්සේ වඳින ගාථා එම ස්ථානවලදීත් කියා වන්දනා කිරීමට යොමු කරන්න.
- ගාථා නිවැරදි ව සජ්ඣායනා කරන්න.

ත්‍රිවිධ චෛත්‍ය රාජයාණන් වහන්සේ වඳින ගාථාව

**වන්දාමි චේතියං සබ්බං - සබ්බඨානෙසු පතිට්ඨිතං**

**සාරීරිකධාතු මහා බෝධිං - බුද්ධරූපං සකලං සදා**

බෝධි රාජයාණන් වහන්සේ වඳින ගාථාව

**යස්ස මූලේ නිසින්නෝව - සබ්බාරි විජයං අකා**

**පත්තෝ සබ්බඤ්ඤුතං සත්ථා - වන්දේතං බෝධිපාදපං**

**පියවර 3 :**

- ස්වාමීන් වහන්සේට ආරාධනා කර දරුවන් වන්දනාවේ යෙදවීමට කටයුතු කරන්න.
- වන්දනා කටයුතු අවසානයේදී දරුවන් ලවා ස්වාමීන් වහන්සේට පිරිකර පූජා කරන්න./ ස්වාමීන් වහන්සේට පසඟ පිහිටුවා වඳින්න.
- මෙම සැම අවස්ථාවකදී ම අවස්ථානුකූලව ශාසනික වචන භාවිත කිරීමට යොමු කරන්න.
- ශාසනික වචන කිහිපයක් හඳුන්වා දෙන්න.

උදා : ⋆ අත් සෝදනවා - අත් දොහොන් කරනවා
⋆ මල් කඩනවා - මල් නෙළනවා
⋆ අතුගානවා - අමදිනවා
⋆ වතුර - පැන්
⋆ මිදුල - මළුව

**ක්‍රියාකාරකම - 2 (කාලය පැය 1)**

**පියවර 1 : පන්සල් ගොස් පැමිණීමෙන් පසු ව**

- පන්සල් යාම පිළිබඳ තම අද්දැකීම් ප්‍රකාශ කරන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.
- පන්සල් යැමට සූදානම් වූ ආකාරය, රැගෙන යන දේවල්, පන්සලේදී සිදු කළ දේවල් සාකච්ඡා කරන්න.
- ක්‍රියාකාරකම් පොතේ "අපි පන්සල් යමු" පාඩම ගුරුතුමිය/තුමා කියවන්න. පින්තූර පෙන්වමින් අද්දැකීම් ප්‍රකාශ කරන්නට සිසුන්ට අවස්ථාව දෙමින් ඒ පිළිබඳ සාකච්ඡා කරන්න.

පියවර 2 :

- ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකාරකම 1 ගුරුතුමිය/තුමා කියවන්න. කළ යුතු දේ පහදා දෙන්න.
- පන්සල් යන විට රැගෙන ගිය මල් කූඩය මතක් කරමින් ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකාරකම 1 සඳහා පහසුකම් සපයා දෙන්න. ඒ සඳහා සිසුන් සියලු දෙනා ම යොමු කරවන්න.
- ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකාරකම 2 සඳහා පහසුකම් සපයා දෙමින් ඒ සඳහා සිසුන් සියලු දෙනා ම යොමු කරවන්න.

පියවර 3 :

- විහාරස්ථානයට ගොස් කරන ලද ආගමික වතාවත් තුළින් දරුවාගේ ජීවිතයට හුරු කර ගත හැකි සිරිත් විරිත් හා වටිනාකම් අවධාරණය කරමින් නැවත නැවතත් සාකච්ඡා කරන්න.
- විහාරස්ථානයේදී අනුගමනය කළ දේවල් නැවත මතක් කරන්න.
- විහාරස්ථානයට ගොස් පළමු ව, දෙවනු ව හා තෙවනු ව වන්දනා කළ ස්ථාන අනුපිළිවෙළින් මතක් කරන්න.

පියවර 4 :

- ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකාරකම 2 - ගුරුතුමිය කියවන්න. කළ යුතු දේ පහදා දෙන්න.
- ක්‍රියාකාරකම සඳහා අවශ්‍ය දේවල් කලින් රැස් කර තබා ගන්න.
- පළමු ව වන්දනා කළ ස්ථානය මතක් කරන්න.
- ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකාරකම 3 - කළ යුතු දේ පහදා දෙන්න. වෙහෙර වහන්සේ ලස්සන කරන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.

පියවර 5 :

- ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකාරකම 4 - පළමු ව ගුරුතුමිය කියවන්න. කළ යුතු දේ පහදා දෙන්න.
- දෙවනු ව වන්දනා කළ ස්ථානය මතක් කරන්න.
- ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකාරකම 4 - බෝධීන් වහන්සේගේ බෝ පත් පාට කරන්න සිසුන්ට අවස්ථාව දෙන්න.

පියවර 6

- තෙවනුව වන්දනා කළ ස්ථානය පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- බුදු පිළිම වහන්සේ වන්දනා කළ බව මතක් කරමින් බුදුරජාණන් වහන්සේගේ පින්තූරයක් සොයා අභ්‍යාස පොතේ අලවන්නට හෝ අඳින්නට සිසුන් යොමු කරන්න.

පියවර 7 :

- ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකාරකම 6 - ගුරුතුමිය කියවන්න. කළ යුතු දේ පහදා දෙන්න.
- ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකාරකම 6 පළමුව ගුරුතුමිය අදාළ වචන ශබ්ද නඟා කියවන්න.
- ගුරුතුමිය/තුමා කියන විට ඒ සමග ම වචන ශබ්ද නඟා කියවීමට සිසුන් ද යොමු කරවන්න.

## තක්සේරු නිර්ණායක

| කාර්යසාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවයට පැමිණ ඇත. | ප්‍රවීණතාවයට දුරස්ථ ය. |
|---|---|---|---|
| | | මට්ටම 2 | මට්ටම 1 |
| 3.1 තම ආගමික ස්ථානය හඳුනා ගෙන නම් කරයි. | 3.1.1 | ත්‍රිවිධ චෛත්‍යය හඳුනා ගෙන පිළිවෙළින් නම් කරයි. | ත්‍රිවිධ චෛත්‍යය හඳුනා ගෙන නිවැරදි ව නම් කිරීමට දුෂ්කරතා දක්වයි. |
| 3.1 ආගමික සිද්ධස්ථානවලදී සුදුසු ඇඳුම්, නිවැරදි කතාබහ භාවිත කරයි | 3.3.1 | සුදුසු සංවර ඇඳුම්වලින් සැරසෙයි. | සුදුසු සංවර ඇඳුම්වලින් සැරසී නොඑයි. |
| | 3.3.2 | සැම විට ම විහාරස්ථානයේදී නිශ්ශබ්දතාව සුරකියි. | විහාරස්ථානයේදී සංසුන් පරිසරයට බාධා වන සේ කතා කරයි. |
| 3.2 ආගමික සිද්ධස්ථානවල දී ආගමානුකූල ව හැසිරෙයි. | 3.2.1 | විහාරස්ථානයේදී සංවර ව හැසිරෙයි. | විහාරස්ථානයේදී සංවර ව හැසිරීම ප්‍රදර්ශනය නොකරයි. |
| 5.2 පූජනීය ස්ථානවල දී නිවැරදි වත්පිළිවෙත් හා සිරිත් විරිත්වලට අනුව කටයුතු කරයි. | 5.2.1 | පන්සල් ගෙන යාමට මල්, තෙල්, පහන්තිර, හඳුන් කූරු රැගෙන එයි. | පන්සල් ගෙන යාමට මල්, තෙල්, පහන්තිර, හඳුන් කූරු රැගෙන නොඑයි. |
| | 5.2.2 | හිස්වැසුම් පාවහන් ගලවා නියමිත ස්ථානවල පිළිවෙළට තබයි. | හිස්වැසුම් පාවහන් ගලවා නියමිත ස්ථානවල පිළිවෙළට තැබීමට උනන්දු නොවෙයි. |
| 6.1 ආගමික වතාවත්වල නිරත වීමේදී නිවැරදි වත් පිළිවෙත්වල යෙදෙයි. | 6.1.1 (a) | බෝ මළුව ඇමදීමේදී සාමූහිකව කටයුතු කරයි. | සාමූහිකව කටයුතු කිරීමට උනන්දුවක් නොදක්වයි. |
| | 6.1.1 (b) | පූජා කිරීමට පෙර මල් ධෝවනය කරයි. | පූජා කිරීමට පෙර මල් ධෝවනය කිරීමට උනන්දු නොවෙයි. |
| | 6.1.1 (c) | වන්දනාවට පෙර හා පසු එම ස්ථාන ඉතා හොඳින් නැවත පිරිසිදු කරයි. | ස්ථාන පිරිසිදු කිරීමට දායකත්වය නොදක්වයි. |
| 6.3 ආගමික වතාවත්වල නිරතවීමේදී නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කරයි | 6.3.1 (a) | නමස්කාර පාඨය කීමේදී දොහොත් මුදුනේ තබා වන්දනා ඉරියව්ව ප්‍රදර්ශනය කරයි. | නමස්කාර පාඨය කීමේදී දොහොත් මුදුනේ තබා වන්දනා ඉරියව්ව ප්‍රදර්ශනය කිරීමට උනන්දු නොවේ. |
| | 6.3.1 (b) | පසඟ පිහිටුවා වැඳීමේ නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කරයි. | පසඟ පිහිටුවා වැඳීමේ නිවැරදි ඉරියවු ප්‍රදර්ශනය කිරීමේ දුර්වලතා පෙන්වයි. |
| 6.4 ආගමික කටයුතුවලදී අදාළ නිවැරදි වචන භාවිත කරයි. | 6.4.1 | අවස්ථානුකූල ව ශාසනික වචන භාවිත කරයි. | අවස්ථානුකූල ව ශාසනික වචන භාවිත නොකරයි. |

**ප්‍රායෝගික** ජීවිතයේ **භාවිතය සඳහා**

- සැම දිනක ම පාසලේ උදෑසන ආගමික වතාවත්වල යෙදෙන අවස්ථාවේදී තිසරණ සහිත පන්සිල් සමාදන් වීමට යොමු කරන්න.
- පන්සිල් සමාදන් වීමට පෙර පූජා ද්‍රව්‍යවලට අත ගසා සාධුකාර දෙන ආකාරය කියා දෙන්න. (සැම පූජා ද්‍රව්‍යයකට ම යටින් අත තබා පූජාව පැවැත්වීමට දායක වන ආකාරය කියා දෙන්න.)
- පන්සිල් සමාදන් වීමට පෙර දොහොත් මුදුනේ තබා නමස්කාර පාඨය කියන ආකාරය ආදර්ශනය කර පෙන්වන්න. අනතුරු ව දෑත නළලට ගෙන වන්දනා කරන්න.
- ශ්‍රද්ධාවෙන් යුතු ව ශිෂ්‍යයන් උදෑසන ආගමික වතාවත්වල නිරත කරවන්න. (සැම අවස්ථාවකදී ම ආගමික වතාවත්වල යෙදෙන නිවැරදි පිළිවෙළ පැහැදිලි කර දෙන්න.)
- නිවසේදී ද දිනපතා තෙරුවන් නැමදීමට ශිෂ්‍යයන් යොමු කරන්න.

(ගුරුතුමිය හෝ ගුරුතුමා ද සිසුන් සමඟ ඉහත ඉරියවු ප්‍රදර්ශනය කරමින් වත්පිළිවෙත් කරමින් වන්දනා කිරීම අනිවාර්යයෙන් ම කළ යුතු ය).

## සංකල්පය - චරිත සංවර්ධනය
## 4 පාඩම - අපූරු සිහිනය
## 5 පාඩම - අසිරිමත් උපත

**පින්වත් පුතෙකු වූ බෝසත් කුමරුගේ උපත සිදුවීමේ පෙර නිමිති, මහාමායා දේවිය දුටු සිහිනය තුළින් සංකේතවත් වන බව සිසුන්ට වටහා දීමත්, බෝසතාණන් වහන්සේගේ උපතේදී සිදුවූ අසිරිමත් සිදුවීම් හඳුනා ගැනීමට සිසුන්හට අවස්ථාව ලබා දීම මෙන්ම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය හඳුනා ගැනීමට යොමු කිරීම මෙම පාඩම්වලින් අපේක්ෂා කෙරේ.**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2.0 බුද්ධ චරිතය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග චරිතායනය කරයි. | මහාමායා දේවිය දුටු සිහිනය<br>අසිරිමත් උපත. | 2.1 බෝසත් උපත පිළිබඳ කතා පුවතට කැමැත්තෙන් සවන් දී ප්‍රතිචාර දක්වයි. | 2.1.1 අවධානයෙන් සවන් දීම<br>2.1.2 නිවැරදි ප්‍රතිචාර දැක්වීම |
| | | 2.2 බෝසත් උපත ආශ්‍රිත විශේෂ සිදුවීම් ප්‍රකාශ කරයි. | 2.2.1 කතන්දර/සිද්ධි විස්තර කිරීම<br>2.2.2 විශේෂ සිදුවීම් ප්‍රකාශ කිරීම |

**ඉගෙනුම් සම්පත් :**

- මහාමායා දේවිය දුටු සිහිනය දැක්වෙන පින්තූර (සිසු ක්‍රියාකාරකම් පොතේ ඇතුළත් වේ.)
- බෝසත් උපත දැක්වෙන පින්තූර (සිසු ක්‍රියාකාරකම් පොතේ ඇතුළත් වේ.)

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම** - 1

**පාඩම - අපූරු සිහිනය**

පියවර 1 -

- පහත කරුණු ඇසුරු කර ගනිමින් මහාමායා දේවිය පිළිබඳ තොරතුරු කතන්දරයක් සේ සිසුන්ට කියා දෙන්න.
  - ❖ මහාමායා දේවිය දඹදිව කපිලවස්තු පුර සුද්ධෝදන රජතුමාගේ අගමෙහෙසිය බව
  - ❖ ඇය සැම දිනක ම අන් අයට උපකාර කරමින් සතුටින් ජීවත් වූ බව
  - ❖ පින්වත්, සිල්වත්, කාරුණික තැනැත්තියක් බව
  - ❖ එවැනි ගුණාංග අපේ ජීවිතයට එකතු කර ගත යුතු බව

පියවර 2

- මහාමායා දේවිය දුටු සිහිනය දැක්වෙන පින්තූරයක්, චිත්‍රයක්, සංයුක්ත තැටියක් ප්‍රදර්ශනය කර ඒ ඇසුරින් මහාමායා දේවිය දුටු සිහිනය පිළිබඳව අදහස් දක්වන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ක්‍රියාකාරකම් පොතේ "අපූරු සිහිනය" පාඩමෙහි පින්තූර ද ආශ්‍රය කර ගෙන මහාමායා දේවිය දුටු සිහිනය කතන්දරයක් ලෙසින් කියා දෙන්න. ඒ සඳහා පහත කරුණු ද යොදා ගන්න.
  - ❖ එදින ඇසළ පුන් පෝය දිනයක් බව
  - ❖ සිල් සමාදන් ව රාත්‍රි නින්දට ගිය මහාමායා දේවිය ලස්සන සිහිනයක් දුටු බව
  - ❖ දෙවිවරු සතර දෙනෙක් දේවිය නිදා සිටි යහන ඔසවා ගෙන හිමාල වනයට ගිය බව

❖ මල් පිපුණු සල් ගසක් යට දේවිය සිටි යහන තැබූ බව

❖ සුරංගනාවියෝ සතර දෙනෙක් දේවිය අනෝතත්ත විලෙන් නහවා සුවඳ ගල්වා, දිව සළු අන්දවා යහනක නිදි කළ බව

❖ ඒ වේලාවේ සුදු නෙලුම් මලක් සොඬින් ගත් සුදු ඇත් පැටවෙක් දකුණු ඇලයෙන් දේවියගේ කුසට ඇතුළු වුණාක් සේ දුටු බව

පියවර 3

- මේ පිළිබඳ ලියවුණු කවි හෝ ගීත ද සිසුන්ට ඇසීමට අවස්ථාව ලබා දෙන්න.
- මහාමායා දේවිය දුටු සිහිනය දක්වෙන චිත්‍ර/මූර්ති/කැටයම් දුටු ස්ථාන මතකයට නංවමින් සිසුන් සමග තව දුරටත් සාකච්ඡා කරන්න.

පියවර 4 :

- ක්‍රියාකාරකම් පොතේ සඳහන් ක්‍රියාකාරකම 1 - පින්තූර බලා මහාමායා දේවිය දුටු සිහිනය විස්තර කරන්නට සිසුන් යොමු කරන්න.
- ඉන් තමා සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නඟන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඒවා පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.

**ක්‍රියාකාරකම - 2**

**පාඩම - අසිරිමත් උපත**

පියවර 1

- රූප රාමු, සංයුක්ත තැටි ආදී සුදුසු ඉගෙනුම් ද්‍රව්‍යයක් යොදා ගනිමින් පහත කරුණු ඉතා සරලව කතන්දරයක් ආකාරයට සිසුන්ට කියා දෙන්න.

  ❖ බෝසත් කුමරු ඉපදීමට ආසන්න කාලයේ මහාමායා දේවියට තම දෙමාපියන් බැලීමට ආසාවක් ඇති වූ බව.

  ❖ සුද්ධෝදන රජතුමාගේ කැමැත්ත ඇතිව කපිලවස්තු පුර සිට මව්පියන් බැලීම සඳහා දෙව්දහ නුවරට පිරිස සමග පිටත්ව ගිය බව.

  ❖ අතරමගදී හමු වූ අලංකාරවත් ලුම්බිණි සල් උයන දැක සිරි නැරඹීම සඳහා නැවතුණ බව.

  ❖ එදා වෙසක් පුන් පොහෝ දිනයක් බව හා ලුම්බිණි සල් උයනේදී බෝසත් කුමරු ඉපදුණ බව.

  ❖ සතරවරම් දෙවිවරු සාදුකාර පැවැත්වූ බව.

  ❖ බෝසත් කුමරු ඉපදුණ මොහොතේ අසිරිමත් සිදුවීම් රැසක් සිදු වූ බව (බෝසත් කුමරු සත් පියුම් මත වැඩම කරවීමත්, අභීත සිංහ නාද පැවැත්වීමත් පිළිබඳ ව පහත සඳහන් ප්‍රකාශය ද යොදා ගනිමින් පැහැදිලි කරන්න.

  **'අග්ගෝහමස්මි ලෝකස්ස - ජෙට්ඨෝහමස්මි ලෝකස්ස**

  **සෙට්ඨෝහමස්මි ලෝකස්ස - අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවෝ'**

  **ලොවට ම අග වෙමි - ලොවට ම දෙටු වෙමි**

  **ලොවට ම සෙට වෙමි - යළි නොම උපදිමි**

  (මෙසේ අප බෝසතාණන් වහන්සේගේ උපත සිදු වූ බවත් උන්වහන්සේ තුන් ලෝකයට ම අග්‍ර බවත් සුදුසු වාංමාලාවකින් සිසුන්ට පැහැදිලි කරන්න.)

පියවර 2

- ක්‍රියාකාරකම් පොතෙහි ඇතුළත් 'අසිරිමත් උපත' පාඩමෙහි පින්තූරය හොඳින් නිරීක්ෂණය කර ඒ පිළිබඳ අදහස් ඉදිරිපත් කරන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙම සාකච්ඡාවේදී ගුරු උපස්තම්භන ලබා දෙමින් අවශ්‍ය මැදිහත්වීම් සිදු කරන්න.

**තක්සේරු නිර්ණායක**

| කාර්යසාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවයට පැමිණ ඇත. | ප්‍රවීණතාවයට දුරස්ථ ය. |
|---|---|---|---|
| | | මට්ටම 2 | මට්ටම 1 |
| 2.1 බෝසත් උපත පිළිබඳ කතා පුවතට කැමැත්තෙන් සවන් දී ප්‍රතිචාර දක්වයි. | 2.1.1 | අවධානයෙන් සවන් දී සිදුහත් බෝසත් කුමරුගේ මවගේ හා පියාගේ නම් ප්‍රකාශ කරයි. | අවධානයෙන් සවන් නොදෙයි. සිදුහත් බෝසත් කුමරුගේ මවගේ හෝ පියාගේ නම් ප්‍රකාශ කිරීමට අපහසුතා දක්වයි. |
| | 2.1.2 | බෝසත් උපත සිදු වූ පොහොය දිනය නම් කරයි. | බෝසත් උපත සිදු වූ පොහොය දිනය නම් කිරීමට අපහසුතා දක්වයි. |
| 2.2 බෝසත් උපත ආශ්‍රිත විශේෂ සිදුවීම් ප්‍රකාශ කරයි. | 2.2.1 | මහාමායා දේවිය දුටු සිහිනය චිත්‍රය ඇසුරෙන් විස්තර කරයි. | මහාමායා දේවිය දුටු සිහිනය චිත්‍රය ඇසුරෙන් විස්තර කිරීමට අපහසුතා දක්වයි |
| | 2.2.2 | බෝසත් උපතේදී වූ අසිරිමත් සිදුවීමක් චිත්‍රය ඇසුරෙන් ප්‍රකාශ කරයි. | බෝසත් උපතේදී වූ අසිරිමත් සිදුවීමක් ප්‍රකාශ කිරීමට අපහසුතා දක්වයි. |

## සංකල්පය - ආචාරධර්ම, සාරධර්ම හා සම්මත
## 6 පාඩම - මව්පිය ආශීර්වාද ලබමු
## 7 පාඩම - ගුරු උතුමන් නමදිමු

**උදේ සවස දෙමව්පියන්ට වැඳීම බොදු දරුවකුගේ සුවිශේෂ ලක්ෂණයක් බව වටහා දීමත්, ගාථා කියමින් දෙමව්පියන් වන්දනා කිරීමට යොමු කිරීමත්, සාම ජාතකය ඇසුරෙන් දෙමව්පියන්ට සැලකීමේ ආනිශංස හා මව්පිය ආශීර්වාදයේ වටිනාකම පිළිබඳ අවබෝධය ලබා දීමත්, ගුරුවරයකු දුටු විට හුනස්නෙන් නැගිට ආචාර කිරීමත්, වැඳ ගරු කිරීමත් බොදු දරුවකුගේ ලක්ෂණ වේ. කුඩා කල සිට ම ඒවා පුරුදු පුහුණු කිරීමෙන් බෞද්ධ දරුවකුගේ අනන්‍යතාව ප්‍රදර්ශනය කරමින් යහගුණදම් සංවර්ධනයට අවශ්‍ය පදනම ගොඩනැගීම මෙම පාඩම්වලින් අපේක්ෂා කෙරේ.**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 7.0 යහපත් දරුවකු ලෙස පිළිපැදිය යුතු සිරිත් විරිත් / ගුණ ධර්ම අවබෝධයෙන් යුතුව අනුගමනය කරයි. | සාම ජාතකය<br>මව්පිය ආශීර්වාද<br>ගුරු වන්දනාව | 7.1 ගුණ ධර්ම/සිරිත් විරිත් ඇතුළත් කතන්දරවලට සවන් දී ප්‍රතිචාර දක්වයි. | 7.1.1 කැමැත්තෙන් සවන් දීම<br>7.1.2 නිවැරදි ප්‍රතිචාර දැක්වීම<br>7.1.3 කතන්දර ගොඩනැගීම |
| | | 7.2 කතන්දර ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 7.2.1 ප්‍රකාශ කිරීම |
| | | 7.3 යහපත් දරුවෙකු ලෙස පිළිපැදිය ගුණ ධර්ම/සිරිත් විරිත් හඳුනා ගනියි. | 7.3.1 නිවැරදි ගුණ ධර්ම ප්‍රකාශ කිරීම<br>7.3.2 නිවැරදි ගුණ ධර්ම/ සිරිත් විරිත් අනුගමනය කිරීම |
| | | 7.4 යහපත් දරුවෙකු ලෙස කටයුතු කරයි. | 7.4.1 ප්‍රකාශ කිරීම<br>7.4.2 නිවැරදි හැසිරීම ප්‍රදර්ශනය කිරීම |

**ඉගෙනුම් සම්පත් :**

- දෙමව්පියන්ට වන්දනා කරන ගාථා ඇතුළත් හඬපට
- සාම ජාතකය දැක්වෙන රූප රාමු, වීඩියෝ පට
- ගුරු වන්දනා ගාථාව

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම** - 1

**පාඩම- මව්පිය ආශීර්වාද ලබමු.**

**පියවර** 1

- සුදුසු ක්‍රමවේදයක් යොදා ගනිමින් මව්පියන්ට වඳින ගාථා අසන්නට සලස්වන්න.
- දෙනෙත් පියා ගෙන එම ගාථාවලට සවන් දීමට යොමු කරන්න.
- සිසුන් සමග එම ගාථා කිහිපවරක් තාලයට සජ්ඣායනා කරන්න.
- එම ගාථාවල තේරුම ඉතා සරලව පහදා දෙන්න.
- දිනපතා උදෑසනත්, රාත්‍රී නින්දට යාමට පෙරත් දෙමාපියන්ට වැඳ ආශීර්වාද ලබා ගැනීම පුරුද්දක්

වශයෙන් කළ යුතු බව අවධාරණය කරමින් ඒ සඳහා යොමු කරන්න.

- සැම දිනක ම දෙමාපියන්ට වැඳ නිවසින් පිටත් වීමත්, නිවසේ දෙමාපියන් නැති අවස්ථාවක වුව ද ඔවුන්ගේ රුව සිතින් මවා ගෙන වන්දනා කිරීමත්, තමන් කුමන වයසක පසුවන අයෙක් වුවත් දෙමාපියන්ගේ ආශීර්වාද ලබා ගැනීම ඉතා වැදගත් බවත් පහදා දෙන්න.
- දෙමව්පියන් ඉතා ආදරයෙන් හා කරුණාවෙන් අපව පෝෂණය කරන බව උදාහරණ දෙමින් දෙමව්පිය ගුණ පිළිබඳ ව සිසුන්ට දැනෙන පරිදි පැහැදිලි කරන්න.
- දෙමව්පියන් අහිමි සිසුන් වේ නම් ඒ ගැන සැලකිලිමත් වන්න.

පියවර 2

- ක්‍රියාකාරකම් පොතෙහි "මව්පිය ආශීර්වාද ලබමු" පාඩමේ පින්තූර නිරීක්ෂණයට සිසුන් යොමු කරන්න.
- එහි සඳහන් වාක්‍ය ගුරුතුමිය විසින් ශබ්ද නඟා කියවන්න.
- පසු ව ගුරුතුමිය සමග සිසුන්ට ද ශබ්ද නඟා කියවන්නට අවස්ථාව ලබා දෙන්න.

පියවර 3

- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 1හි ඇති පින්තූර කතාව ගොඩනඟන්නට සිසුන් යොමු කරන්න. අවශ්‍ය අවස්ථාවලදී ගුරු මැදිහත්වීම සිදු කරන්න.
- එම චිත්‍ර ඇසුරු කර ගනිමින් සාම ජාතකය සිත් ගන්නා ආකාරයට සිසුන්ට කියා දෙන්න.
- මේ සඳහා පහත කරුණු ඇසුරු කර ගත හැකි වේ.
  * බරණැස් නුවර සාම නම් කුමාරයෙක් සිටිය බව
  * සාම කුමරු දෙඇස් නොපෙනෙන තම මව්පියන්ට සලකමින් ඔවුන් සමග ඉතා සතුටින් ජීවත් වූ බව
  * දිනපතා තමාගේ යහළු සතුන් සමග එකතුව තම මව්පියන්ට ආහාර සොයා ගෙන එන බව
  * සාම කුමරු සත්ත්ව යහළුවන් සමග ඉතා සතුටින් හා විනෝදයෙන් කාලය ගත කළ බව
  * එක් දිනක් සාම කුමරු යහළු සතුන් සමග පැන් ගෙන ඒමට ගඟට ගිය බව
  * එදා බරණැස් රජතුමා පිරිස සමග දඩයමේ ගිය බව
  * මෙසේ දඩයමේ යද්දී දුටු මුවකුට රජු හීයකින් විද්ද බව
  * එම හීය වැදී සාම කුමරු සිහිසුන් ව ඇදවැටුණු බව
  * රජතුමා දුක් වූ බව හා කුමරුට සිහිය ගැනීමට නොහැකි වූ බව
  * පසුව කුමරුගේ දෙමව්පියන් එම ස්ථානයට ගෙන්වා ගත් බව
  * "අප ව ආදරයෙන් රැක බලා ගනිමින් ජීවත් වූ අපේ පුතාට සිහිය ලැබේවා!" යි කුමරුගේ දෙමව්පියන් සත්‍යක්‍රියා කළ බව
  * දෙමව්පියන්ගේ සත්‍යක්‍රියාව නිසා කුමරාට සිහිය ලැබුණ බව
- දෙමව්පියන් ලබා දෙන ආශිර්වාදය ඉතා බලවත් බව සාම ජාතකය ඇසුරෙන් පහදා දෙන්න.
- සාම කුමරු දෙමව්පියන්ට කරන ලද උදවු මොනවා දැයි ප්‍රකාශ කරන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.
- දෙමව්පියන්ට සලකන දරුවන්ට සැම දෙනාගේ ම ආශිර්වාදය ලැබෙන බව තව දුරටත් උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම - 2**

**පියවර 1**

- දෙමව්පියන්ගේ ගුණ සඳහන් වන සුදුසු ගීතයකට සවන් දීමට සිසුන් යොමු කරන්න.
- සිසුන්ට ද තාල තබමින් ගීතය ගායනා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එහි අදහස සිසුන්ගෙන් විමසන්න.
- සිසු අදහස් ද අගය කරමින් ගීතයේ අදහස ඉතා සරල ව සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- දෙමාපියන් අපට කරන උදවු මොනවා දැයි සිසුන්ගෙන් විමසන්න.
- කුඩා දරුවන් වන ඔබ විසින් දෙමව්පියන්ට කරන උදවු මොනවා දැයි විමසන්න. සැම සිසුවෙකුට ම තම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- දෙමව්පියන්ට උදවු උපකාර කිරීම හා සැලකීම අප කාගේත් යුතුකමක් හා වගකීමක් වන බව අවධාරණය කරමින් සිසුන් සමග සාකච්ඡා කරන්න.
- නැවත වරක් සිසුන් සමග ගීතය තාල තබමින් ගායනා කරන්න.
- "මම අම්මාටත්, තාත්තාටත් උදවු කරනවා" චිත්‍රයක් අඳින්නට සිසුන් යොමු කරන්න.
- සිසුන් අඳින ලද චිත්‍ර පිළිබඳ විමසමින් තම චිත්‍රය පිළිබඳ විස්තර කිරීමට එක් එක් සිසුවාට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම - 3**

**පාඩම - ගුරු උතුමන් නමදිමු**

**පියවර 1**

- ගුරුවරුන්ගේ ගුණ දැක්වෙන සුදුසු කවියක් හෝ ගීතයක් ගායනා කරන්න.

  අඳුරෙන් එළියට යන මග කියනා
  දැනුමෙන් සවියෙන් මුවහත් කරනා
  ඇල්මෙන් කැල්මෙන් ඔවදන් බෙදනා
  ගුරු මවු පියවරු නමදිමු බැතිනා

- කවිය ඇසුරින් ගුරුවරුන්ගේ වටිනාකම් ගැන පහදා දෙන්න.
- ගුරුවරයකු දුටු විට හුනස්නෙන් නැගිට ආචාර කිරීමට හුරු කරවන්න.
- ගුරු වන්දනා ගාථාව පාඩම් කරන්නට යොමු කරන්න. ගුරු වන්දනා ගාථාව කියා ගුරුවරුන්ට වන්දනා කරන්නට සිසුන්ව යොමු කරවන්න.
- ගුරුවරුන්ගෙන් අපේ ජීවිතයට ලැබෙන උදවු උපකාර මොනවා දැයි සිසුන්ගෙන් අදහස් විමසමින් සකච්ඡා කරන්න.

ගුරු වන්දනා ගාථාව -

ඕවාද සිප්ප දානේන
සික්ඛාපේති මමං ගරු
සගාරවේන චිත්තේන
අහං වන්දාමි තං ගරුං

සිංහල තේරුම

ඔවා සිප් දීමෙන
මා හික්මවන අදරින
ඇදුරු හද බැතියෙන
වදිමි ගරුසිත පෙරටු කරමින

- "මගේ ගුරුතුමා/තුමිය" චිත්‍රයට නඟන්නටත්, ගුරුතුමිය/තුමා පිළිබඳ පන්තිය ඉදිරියේ අදහස් ඉදිරිපත් කරන්නටත් සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. සිසු ඉදිරිපත් කිරීම් අගය කරන්න.

තක්සේරු නිර්ණායක

| කාර්යසාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවයට පැමිණ ඇත. | ප්‍රවීණතාවයට දුරස්ථ ය. |
|---|---|---|---|
| | | මට්ටම 2 | මට්ටම 1 |
| 7.1 ගුණ ධර්ම/ සිරිත් විරිත් ඇතුළත් කතන්දරවලට සවන් දී ප්‍රතිචාර දක්වයි | 7.1.3 | පින්තූර ඇසුරෙන් සාම කුමාරයාගේ කතාව පිළිවෙළින් ගොඩනගයි. | පින්තූර ඇසුරෙන් සාම කුමාරයාගේ කතාව ගොඩනැගීමෙහි දුෂ්කරතා පෙන්වයි. |
| | 7.1.2 | සාම කුමරුගේ කතාවෙහි ඇතුළත් චරිතයක් නම් කරයි. | චරිතයක් නම් කිරීමට අපහසුතා දක්වයි. |
| | 7.2.1 | කතාව ඇසුරෙන් ලබාගත් ආදර්ශයක් ප්‍රකාශ කරයි. | කතාව ඇසුරෙන් ලබාගත් ආදර්ශයක් ප්‍රකාශ කිරීමට අපහසුතා දක්වයි. |
| | 7.3.1 | දිනපතා ම දෙමව්පියන් නමදින බව ප්‍රකාශ කරයි. | දිනපතා දෙමව්පියන් නැමදීමට නොහැකි වූ බව ප්‍රකාශ කරයි. |
| | 7.3.2 | ගුරු වන්දනා ගාථාව සජ්ඣායනය කරයි. | ගුරු වන්දනා ගාථාව සජ්ඣායනය කිරීමට අපහසුතා දක්වයි. |
| | 7.4.1 | දෙමව්පියන්ට උදවු කළ අවස්ථාවක් ප්‍රකාශ කරයි. | දෙමව්පියන්ට උදවු කළ අවස්ථාවක් ප්‍රකාශ කිරීමට අපහසුතා දක්වයි. |
| | 7.4.2 | සැම විටම ගුරුවරයා සමඟ සුහද ව හා ආචාරශීලී ව කටයුතු කරයි. | ගුරුවරයා සමඟ සුහද ව හා ආචාරශීලී ව කටයුතු කිරීමට දුෂ්කරතා දක්වයි. |

★★★ මෙහි ඇතුළත් සමහර නිර්ණායක තක්සේරු කිරීම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී පමණක් සිදු කිරීම අපහසු ය. එවැනි අවස්ථාවල දී වර්ෂය පුරා සිදු කෙරෙන තක්සේරු කිරීම් ද යොදා ගැනීම සුදුසු වේ.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- පුරුද්දක් වශයෙන් දිනපතා ගාථා කියා මවට /පියාට වැඳ ආශීර්වාද ලබා ගන්න.
- පුරුද්දක් වශයෙන් දිනපතා පාසල අවසන් වී පාසලෙන් පිටත් වීමට පෙර අදාළ ගාථාව කියා පන්තියේ ගුරුතුමාට/ගුරුතුමියට වඳින්න.

## සංකල්පය - පාරිසරික සංවේදීතාව
## 8 පාඩම - දන් දී අපි පින් පුරමු

සතුන්ට කරුණාව දැක්වීම උතුම් ගුණාංගයක් බව බුද්ධ දේශනාවේ සඳහන් වේ. දරුවන් තුළ සතුන්ට කරුණාව දැක්වීමේ ගුණාංගය වර්ධනය කිරීමත්, අනුකම්පා බුද්ධියෙන් යුක්ත ව දානමය පින්කම්වල නිරත වීමට මූලික හුරුව ලබා දීමත් මෙයින් අපේක්ෂිත ය.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 9.0 බුදුරජාණන්වහන්සේ සොබාදහමේ වටිනාකම ඉස්මතු කළ ආකාරය පිළිබඳ දැනුවත් වෙමින් ක්‍රියා කරයි. | කුරුලු ලැල්ල | 9.3 සතුන් කෙරෙහි සංවේදී බව ප්‍රකාශ කරයි. | 9.3.1 ආදරය දැක්වීම<br>9.3.2 වාචික ප්‍රකාශන ඉදිරිපත් කිරීම |
| | | 9.4 සතුන්ට ආහාර පාන ලබා දීමට ස්ථානයක් සකස් කරයි. | 9.4.1 සාමූහික ව ස්ථානය සකස් කරීම |
| | | 9.5 අනුකම්පාවෙන් යුතු ව සතුන්ට ආහාරපාන ලබා දෙයි. | 9.5.1 ආහාර පාන ලබා දීම<br>9.5.2 ස්ථානය පිරිසිදු කිරීමට දායක වීම |

**ඉගෙනුම් සම්පත් :**

- කුරුලු ලැල්ල සකස් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය
- චිත්‍ර ඇඳීමට අවශ්‍ය ද්‍රව්‍ය

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම** - 1

**පාඩම** - **දන් දී පින් පුරමු**

පියවර 1

- දිනපතා ගෙවත්තට පැමිණෙන සතුන් කවුරුන් දැයි විමසන්න.
- ඔවුන් ආහාර සොයා ගන්නා ආකාරය හා ඔවුන්ගේ හැසිරීම් පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- පාසල් වත්තට පැමිණෙන සතුන් පිළිබඳ විමසමින් ඔවුන්ගේ හැසිරීම් නිරීක්ෂණය කරන්නට දරුවාට අවස්ථාව ලබා දෙන්න. (සිසුන්ගේ ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වන්න.)
- ප්‍රායෝගික අද්දැකීම් ලබා දිය නොහැකි අවස්ථාවල වීඩියෝ පට යොදා ගන්න.
- එම සතුන් ආහාර සොයා ගන්නා ආකාරය පිළිබඳ දරුවන් සමග කතා කරන්න.

පියවර 2

- බුදුරජාණන් වහන්සේ සතුන් කෙරෙහි අනුකම්පාවෙන් ආහාරපාන ලබා දුන් අවස්ථාවන්ට උදාහරණ බෝසත් චරිතය/බුද්ධ චරිතය/ජාතක කතා ඇසුරින් සොයා ඉදිරිපත් කරන්න.
- ඒ ඇසුරෙන් සතුන් කෙරෙහි අනුකම්පාවෙන් දන් දීම පිළිබඳ සාකච්ඡා කරන්න.

පියවර 3

- ක්‍රියාකාරකම් පොතෙහි "දන් දී පින් පුරමු" පාඩමේ ඇතුළත් කවි කතාව සිසුන් සමග හඬ නඟා ගායනා කරන්න.
- එම කවිවල අදහස සිසුන්ගෙන් විමසමින් සාකච්ඡා කරන්න.
- පින්තූර බලා කතාව කියන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.
- පාඩමේ සඳහන් ආකාරයට කුරුල්ලන්, ලේනුන් වැනි සතුන්ට කෑම දීම සඳහා ස්ථානයක් සැකසීම පිළිබඳ සිසු අදහස් ලබා ගන්න.
- කුරුලු ලැල්ල යන නම යෙදුණත් එහි ආහාර ගැනීමට විවිධ සතුන් පැමිණෙන බව සිසුන්ගේ අද්දැකීම් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරකම - 2**

**කුරුලු ලැල්ලක් සකස් කිරීම**

**(කාලය සුදුසු පරිදි යොදා ගන්න)**

පියවර 1

- කුරුලු ලැල්ලක් සකස් කිරීම සඳහා පාසලේ සුදුසු ස්ථානයක් තෝරා ගන්න.
- සිසුන් ද සහභාගි කර ගනිමින් පහසු ආකාරයට සතුන්ට ආහාර දීම සඳහා කුරුලු ලැල්ල සකස් කරන්න. (මේ සඳහා සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කරන්න.)

පහත පින්තූරවලින් උදාහරණ කිහිපයක් දක්වා ඇත.



- සතුන් වෙනුවෙන් බීමට ජල බඳුනක් ද සුදුසු ක්‍රමවේදයකට අනුව තබන්න.
- විවේකයේදී ආහාර ගැනීමට පෙර ආහාරයෙන් කොටසක් කුරුලු ලැල්ලේ තැබීමට හුරු කරන්න. (ආහාර අපතේ නොයන පරිදි කුරුලු ලැල්ලේ කෑම දීමට සුදුසු ක්‍රමවේදයක් සකසා ගන්න.)
- කුරුල්ලන් ලේනුන් වැනි සතුන් ආහාර ගන්නා ආකාරය (බාධා නොවන සේ) නිරීක්ෂණයට ඉඩ දෙන්න.
- දිනපතා බීමට සුදුසු පිරිසිදු ජලය, ජල බඳුනට එකතු කරන්න.
- ආරක්ෂාකාරීව දිනපතා කුරුලු ලැල්ල හා ජල බඳුන පිරිසිදු කිරීමටත් ඒ අවට අලංකාර ව හා පිරිසිදුව තබා ගැනීමටත් සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 3**

පියවර 1 :

- ක්‍රියාකාරකම් පොතෙහි ක්‍රියාකාරකම 1 - "අපේ කුරුලු ලැල්ල" චිත්‍රයට නඟන්නට සිසුන්ව යොමු කරන්න.
- යහළුවන්ගේ චිත්‍ර නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දෙන්න. චිත්‍රය පිළිබඳ සාකච්ඡා කිරීමට යොමු කරන්න.
- අන් අයගේ චිත්‍ර අගය කිරීමට සිසුන්ව යොමු කරන්න. ගුරු උපස්තම්භන ලබා දෙන්න.

පියවර 2 :

- ක්‍රියාකරකම් පොතෙහි - අපේ කුරුලු ලැල්ලට පැමිණි සතුන්ගේ රූප සොයා අලවන්නට පහසුකම් සපයා දෙමින් ඒ සඳහා සිසුන් සියලු දෙනා ම යොමු කරවන්න.

## තක්සේරු නිර්ණායක

| කාර්යසාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවයට පැමිණ ඇත. | ප්‍රවීණතාවයට දුරස්ථ ය. |
|---|---|---|---|
| | | මට්ටම 3 | මට්ටම 1 |
| 9.3 සතුන් කෙරෙහි සංවේදී බව ප්‍රකාශ කරයි. | 9.3.2 | සතුන් කෙරෙහි සංවේදී බව කියවෙන ප්‍රකාශයක් පවසයි. | සතුන් කෙරෙහි සංවේදී බව කියවෙන ප්‍රකාශයක් පැවසීමට උනන්දුවක් නොදක්වයි. |
| 9.4 සතුන්ට ආහාර පාන ලබා දීමට ස්ථානයක් සකස් කරයි. | 9.4.1 | සතුන්ට ආහාර පාන ලබාදීම සඳහා ස්ථානයක් සැකසීමට සාමූහිකව දායක වෙයි. | සතුන්ට ආහාර පාන ලබාදීම සඳහා ස්ථානයක් සැකසීමට දායකත්වය නොදක්වයි. |
| 9.5 අනුකම්පාවෙන් යුතු ව සතුන්ට ආහාරපාන ලබා දෙයි. | 9.5.1 | සතුන්ට ආහාර හා ජලය ලබා දෙයි. | සතුන්ට ආහාර හා ජලය ලබාදීමට උනන්දුවක් නොදක්වයි. |
| | 9.5.2 | සතුන්ට ආහාර හා ජලය ලබා දෙන ස්ථානය පිරිසිදු කිරීම සඳහා දායක වෙයි. | සතුන්ට ආහාර හා ජලය ලබා දෙන ස්ථානය පිරිසිදු කිරීම සඳහා දායකත්වය නොදක්වයි. |

★★★ මෙහි ඇතුළත් සමහර නිර්ණායක තක්සේරු කිරීම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී පමණක් සිදු කිරීම අපහසු ය. එවැනි අවස්ථාවලදී වර්ෂය පුරා සිදු කෙරෙන තක්සේරු කිරීම් ද යොදා ගැනීම සුදුසු ය.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සතුන් කෙරෙහි අනුකම්පාවෙන් ආහාරපාන ලබා දීම හා ආහාරපාන ලබා දෙන ස්ථාන පිරිසිදු කර පවත්වා ගෙන යාමට යොමු කරන්න.
- නිවසේදී කුරුලු ලැල්ලක් සකස් කර සතුන්ට ආහාර දීමටත් ආහාර ගන්නා අයුරු නිරීක්ෂණය කිරීමටත් (දෙමව්පිය සහයෝගය සහිත ව) මග පෙන්වන්න. සිසුන්ගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වන්න.

## සංකල්පය - සතිමත්බව සෞඛ්‍යය හා යහපැවැත්ම
## 9 පාඩම - පුංචි සිතක සතිමත්බව

ජීවිතයේ එදිනෙදා කටයුතුවලදී සතිමත් ව කටයුතු කිරීමට අවශ්‍ය මූලික හුරුව ලබා දීම වෙනුවෙන් සතිමත් ව ඇවිදීම සඳහා කුඩා අවධියේ සිට ම යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 11.0 දෛනික ක්‍රියාකාරකම්වලදී මනා සිහියෙන් යුතුව කටයුතු කරයි. | සතිමත් ව ඇවිදීම | 11.1 ඇවිදීමේදී මනා සිහියෙන් යුතුව ඇවිදියි.<br>11.2 ඇවිදීමේදී යටි පතුලට දැනෙන රළු-සිනිඳු, තෙත-වියළි, උණුසුම-සිසිල් බව හඳුනා ගනිමින් ඇවිදියි. | • සිහියෙන් ඇවිදීම<br>• අද්දැකීම් ප්‍රකාශ කිරීම |

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**ක්‍රියාකාරකම 1**

**පාඩම - පුංචි සිතක සතිමත්බව**

**පියවර 1 :**

- පන්ති කාමරයෙන් පිටත බාධාවකින් තොර ව ඇවිදිය හැකි ස්ථානයකට සිසුන් සියලු දෙනා ම කැඳවා ගෙන යන්න.
- තම සපත්තු මේස් ගලවා පිළිවෙළට එක් ස්ථානයක තබන්නට යොමු කරන්න.
- ඇවිදීමේදී පියවර තැබිය යුතු සීමාවන් සුදුසු ආකාරයට සලකුණු කර ගන්න.
- තෝරා ගත් ස්ථානයේ කෙළවරක එකිනෙකා අතර පරතරයක් ඇති ව සිසුන් එකිනෙකා ස්පර්ශ නොවන පරිදි දෙඅත් පිටුපසට තබා ගෙන සිට ගැනීමට සිසුන් සියලු දෙනා ම යොමු කරන්න.
- සිසුන්ගෙන් මෙසේ විමසන්න.
  - * ඔබ හිටගෙන සිටින බව දැනෙනවා ද?
  - * ඔබේ ශරීරයේ බර කකුල්වලට දැනෙනවා ද?
  - * ඔබ හිටගෙන සිටින විට කකුලට දැනෙන්නේ මොනවා ද?
  - * ඔබේ පතුලට පොළොවේ ස්පර්ශය දැනෙන්නේ කෙසේ ද?
  - * රළුවට, සිනිඳුවට, උණුසුමට සිසිලට දැනෙනවා ද ?
  - * ඔබේ කොන්ද කෙළින් ඇති බව දැනෙනවා ද ?
- සිහියෙන් යුතු ව ඇවිදින ආකාරය ගුරුවරයා ආදර්ශනය කර පෙන්වන්න.
- පසු ව තෝරා ගත් කොටසේ සිහියෙන් යුතුව සෙමෙන් සෙමෙන් එහා මෙහා ඇවිදින්නට සිසුන් ව යොමු කරන්න.
- ඇවිදින වේගය වෙනස් කරමින් එය සිදු කරන්න.
- වම් කකුල තබන විට සිරුරේ බර වම් කකුලටත් දකුණු කකුල තබන විට සිරුරේ බර දකුණු කකුලටත් දැනෙනවා දැයි සිසුන්ගෙන් විමසන්න.

- පොළොවේ රළුබව, සිනිඳුබව, උණුසුම, සිසිලස ආදිය තම කකුල්වලට දැනෙන ආකාරය ගැන ම මෙනෙහි කරමින් අවධානයෙන් යුතු ව ඇවිදීමට සිසුන් යොමු කරන්න. (සරල බසකින් සිසුන්ට පැහැදිලි කරන්න.)
- මෙලෙසින් විනාඩි කිහිපයක් සතිමත් ව ඇවිදීමට සියලු සිසුන් යොමු කරන්න.
- සතිමත් ව ඇවිද ගෙන ම පන්ති කාමරයට යන්නට සිසුන් ව යොමු කරන්න.



පියවර 2 :

- සතිමත් ඇවිදීමෙන් ලත් අද්දැකීම් එකිනෙකාගෙන් විමසන්න. සෑම සිසුවෙකුට ම තම අද්දැකීම් ප්‍රකාශ කරන්නට අවස්ථාව දෙන්න.
- සතිමත් වීමෙන් ලැබෙන ප්‍රයෝජන කවරේ දැයි සිසුන්ගෙන් විමසන්න.
- නිරෝගීමත් ජීවිතයක් ගත කිරීමට සතිමත්ව ඇවිදීම ප්‍රයෝජනවත් වන බව පැහැදිලි කර දෙන්න.
- කුඩා කළ සිට ම නිතර සතිමත් ව කටයුතු කිරීමට හුරු විය යුතු බව පහදා දෙන්න. මේ සඳහා ක්‍රියාකරකම් පොතේ පාඩම ද යොදා ගන්න.

තක්සේරු නිර්ණායක

| කාර්යසාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවයට පැමිණ ඇත. | ප්‍රවීණතාවයට දුරස්ථ ය. |
|---|---|---|---|
| | | මට්ටම 2 | මට්ටම 1 |
| 11.1 ඇවිදීමේ දී මනා සිහියෙන් යුතුව ඇවිදියි. | 11.1.1 | දෙන ලද උපදෙස් සියල්ලම පිළිපදිමින් සතිමත් ව ඇවිදියි. | දෙන ලද උපදෙස් පිළිපදිමින් සතිමත් ව ඇවිදීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 11.2 ඇවිදීමේ දී යටි පතුලට දැනෙන රළු-සිනිඳු, තෙත-වියළි, උණුසුම-සිසිල් බව හඳුනා ගනිමින් ඇවිදියි. | 11.2.1 | සතිමත් ව ඇවිදීමෙන් ලත් අද්දැකීම් ප්‍රකාශ කරයි. | සතිමත් ව ඇවිදීමෙන් ලත් අද්දැකීම් ප්‍රකාශ කිරීමට අපහසුතා දක්වයි. ප්‍රායෝග |

## ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා

- පුරුද්දක් වශයෙන් දිනකට විනාඩි කිහිපයක් සතිමත් ව ඇවිදීම

# බුද්ධ ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

1 ශ්‍රේණිය

දෙවන වාරය

## සංකල්පය - චරිත සංවර්ධනය
## 1 පාඩම - පුංචි සිතයි සිල් සුවඳයි

**සිල් සමාදන් වී සිල් සුරැකීම බොදු දරුවකුගේ හොඳ ලක්ෂණයක් බව අවධාරණය කරමින් සිල් සමාදන්වීමේ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට සිසුන් යොමු කිරීම මෙම පාඩමේ අරමුණ වේ.**

**ඉගෙනුම් පලඃ**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 1. චරිත සංවර්ධනයට අදාළ මූලික ආගමික ඇවතුම් පැවතුම්, වාග් මාලාව, ආගමික සංකේත හා ආගමික පාඨ ඇසුරින් තම ආගම පිළිබඳ සංකල්පය හඳුනාගෙන කටයුතු කරයි. | සීල සමාදාන වැඩසටහන<br><br>තෙරුවන් | 1.4 ආගමට සුවිශේෂ වූ අවස්ථාවන්වලට සහභාගී වී අද්දැකීම් ලබයි. | 1.4.1 නියමිත පරිදි සූදානම් වීම<br>1.4.2 අවස්ථානුකූල ව හැසිරීම<br>1.4.3 නිවැරදි ව හඳුනාගෙන වන්දනා කිරීම<br>1.4.4 අද්දැකීම් ප්‍රකාශ කිරීම |
| | ආගමික වදන් /පාඨ | 1.3 ආගමට සුවිශේෂ වූ වදන් / පාඨ හඳුනාගෙන උචිත අවස්ථාවන්හි දී භාවිත කරයි. | 1.3.1 නිවැරදි ව සුවිශේෂ ආගමික වදන් /පාඨ හඳුනා ගැනීම<br>1.3.2 උචිත අවස්ථාවන්හි දී භාවිත කිරීම |

**ඉගෙනුම් සම්පත්**
- සීල සමාදාන වැඩසටහන සඳහා අවශ්‍ය ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

ක්‍රියාකාරකම 1

පියවර 1 ඃ
- වෙසක්/පොසොන්/ඇසළ ආදී පෙර පොහොය වැඩසටහනක් සුදුසු පරිදි මේ සඳහා යොදා ගන්න.
- පාසලේ සීල සමාදානය සඳහා සුදුසු වැඩසටහනක් සැලසුම් කරගන්න.

පියවර 2 ඃ
- දෙමාපියන්ගේ ද සහය ලබා ගනිමින් පාසලේ සීල සමාදාන වැඩසටහන සඳහා සුදුසු පරිදි පාසල් පරිසරය සකස් කරන්න.
- ස්වාමීන් වහන්සේ නමක් වැඩම කරවාගැනීමට අවශ්‍ය කටයුතු සූදානම් කරන්න.

පියවර 3 ඃ
- දෙමාපියන්ගේ ද සහය ඇති ව නියම කරගත් පරිදි සිසුන් සීල සමාදානයේ නිරත කරවන්න. පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය ලබා දෙන්න.
  - ⋆ සුදුසු ඇඳුමෙන් සැරසී සිටිය යුතු ය.
  - ⋆ නිවැරදි ආකාරයට පූජා ද්‍රව්‍ය අත ගැසීම, තැන්පත් කිරීම හා වන්දනා කිරීම සිදු කරවන්න.
  - ⋆ සිල් සමාදන් වූ විට ගන්නා ආහාරය දානය බව තහවුරු කරන්න.
  - ⋆ ස්වාමීන් වහන්සේ නමක් ලවා කුඩා දරුවන්ට ගැළපෙන සේ ධර්ම දේශනාවක් පැවැත්වීමට කටයුතු සංවිධානය කරගන්න.
  - ⋆ සරල භාවනාවක නිරත කරවන්න.

පියවර 4 ඃ
- සකස් කරගත් වැඩසටහනට අනුව සිල් පවාරණ කටයුතු කරන්න.
- සීල සමාදානය සිදු කළ ස්ථානය පෙර තිබූ පරිදි නැවත සකස් කරන්න.
- තැන්පත් කළ පූජා ද්‍රව්‍ය නිසි පරිදි ඉවත් කර පිරිසිදු කරන්න.

**ක්‍රියාකාරකම 2**

**පියවර 1 :**

- සීල සමාදානය පිළිබඳ තම අත්දැකීම් ප්‍රකාශ කරන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.
- සීල සමාදන්වීමට සූදානම් වූ ආකාරය, රැගෙන ආ දේවල්, සිදු කළ වතාවත් හා එදින ගත කළ ආකාරය සාකච්ඡා කරන්න.
- "පුංචි සිතයි සිල් සුවඳයි" පාඩම ගුරුතුමිය/තුමා කියවන්න. පින්තූර පෙන්වමින් අත්දැකීම් ප්‍රකාශ කරන්නට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. පාඩම සුදුසු පරිදි සාකච්ඡා කරන්න.

**පියවර 2 :**

- ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකාරකම 1 ගුරුතුමිය/තුමා කියවන්න. කළ යුතු දේ පහදා දෙන්න.
- සීල සමාදන් වූ දා කළ පින්කම් මතක් කරමින් ක්‍රියාකරකම් පොතේ ක්‍රියාකාරකම 1 සිදු කිරීම සඳහා පහසුකම් සපයා දෙන්න. ඒ සඳහා සිසුන් සියලුදෙනාම යොමු කරවන්න.

**තක්සේරු නිර්ණායක**

| කාර්යසාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවයට පැමිණ ඇත | ප්‍රවීණතාවයට දුරස්ථ ය. |
|---|---|---|---|
| | | මට්ටම 3 | මට්ටම 1 |
| 1.4 ආගමට සුවිශේෂ වූ අවස්ථාවන්ට සහභාගී වී අත්දැකීම් ලබයි. | 1.4.1 | සිල් සමාදන් වීම සඳහා නියමිත පරිදි සූදානම් වෙයි. | සිල් සමාදන් වීම සඳහා නියමිත පරිදි සූදානම්වීමට නොහැකි වෙයි. |
| | 1.4.2 | සංවර ව හැසිරීම ප්‍රදර්ශනය කරයි. | සංවර ව හැසිරීම ප්‍රදර්ශනය නොකරයි. |
| | 1.4.3 | දොහොත් මුදුනේ තබා වන්දනා ඉරියව්ව ප්‍රදර්ශනය කරමින් නමස්කාර පාඨය කියයි. | දොහොත් මුදුනේ තබා වන්දනා ඉරියව්ව ප්‍රදර්ශනය කරමින් නමස්කාර පාඨය කීමේ දුර්වලතා ප්‍රදර්ශනය කරයි. |
| 1.3 ආගමට සුවිශේෂ වූ වදන් උචිත අවස්ථාවන්හි දී භාවිත කරයි. | 1.3.1<br>1.3.2 | අවස්ථානුකූල ව ශාසනික වචන භාවිත කරයි. | අවස්ථානුකූල ව ශාසනික වචන භාවිත නොකරයි. |

## සංකල්පය - චරිත සංවර්ධනය
## 2 පාඩම - රාහුල පොඩි හාමුදුරුවෝ

අනතිමානී ගුණය සාර්ථක ජීවිතයක් ගොඩ නගා ගැනීමට හේතු වන බව රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතයෙන් පැහැදිලි කර දී දරුවන් තුළ එම ගුණය ජනිත කරවීම මෙම පාඩමේ අරමුණ වේ.

**ඉගෙනුම් පල:**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2.0 බුද්ධ චරිතය /ජාතක කතා /චරිතාපදාන /උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග චරිතායනය කරයි. | රාහුල පොඩි හාමුදුරුවෝ | 2.4 ආගමික චරිතාපදාන ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.4.1 අවධානයෙන් සවන්දීම<br>2.4.2 නිවැරදි ප්‍රතිචාර දැක්වීම |
| | | | 2.4.3 ආදර්ශ ප්‍රකාශ කිරීම |

**ඉගෙනුම් සම්පත්**
- රාහුල පොඩි හාමුදුරුවන් ගැන කියවෙන ක්‍රියාකරකම් පොතේ කවි
- වැලි දෝතක්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**ක්‍රියාකාරකම 1**

පියවර 1 :
- රාහුල පොඩි හාමුදුරුවන් පිළිබඳ සිසුන් දන්නා තොරතුරු ඇසුරින් සාකච්ඡාව අරඹන්න.
- ක්‍රියාකරකම් පොතේ ඇති "රාහුල පොඩි හාමුදුරුවෝ" පාඩම සිසුන් සමග සහකියවීම හෝ තාලානුකූලව ගායනා කරන්න.
- පාඩම ඇසුරින් රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතයෙන් සිසුන්ට ලබා ගත හැකි ආදර්ශ මතු කරමින් කතා කරන්න.
  - ⋆ රාහුල පොඩි හාමුදුරුවෝ පිළිවෙළකට වැඩකළ බව
  - ⋆ වැරදි නිවැරදි කර ගැනීමට උනන්දු වූ බව
  - ⋆ වැඩිහිටියන් දෙන අවවාද පිළිගනිමින් ඒ අනුව කටයුතු කළ බව

**ක්‍රියාකාරකම 2**

පියවර 1 :
- වැලි දෝතක් සපයා ගෙන එහි වැලි කැට බොහෝ ගණනක් ඇති බව පෙන්වා දෙමින් රාහුල පොඩි හාමුදුරුවන් ඒවාගේ වැඩිහිටියන්ගෙන් බොහෝ අවවාද ලබන්නට ප්‍රාර්ථනා කළ අයුරු සිසුන්ට පහදා දෙන්න.
- මව්පියන්, ගුරුවරුන් හා වැඩිහිටියන්ගේ යහපත් ඔවදන්වලට කීකරු වීම බොදු දරුවකු තුළ තිබිය යුතු ගුණාංගයක් බව උදාහරණ සහිතව කියාදෙන්න.
- සිසුන් සමග එක් ව රාහුල පොඩි හාමුදුරුවන් ගැන ඉගෙන ගත් බොදු කවි නැවත වරක් ගායනා කරන්න.

**තක්සේරු නිර්ණායක**

| කාර්යසාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවයට පැමිණ ඇත | ප්‍රවීණතා මට්ටමෙන් දුරස්ථය |
|---|---|---|---|
| | | මට්ටම 2 | මට්ටම 1 |
| 2.4 ආගමික චරිතාපදාන ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.4.1 | රාහුල පොඩි හාමුදුරුවන්ගේ කතාවට ඉතා හොඳින් සවන් දී එහි සඳහන් දින චරියාවෙහි අවස්ථාවක් ප්‍රකාශ කරයි. | රාහුල පොඩි හාමුදුරුවන්ගේ කතාවට සවන් දී එහි සඳහන් දින චරියාවෙහි අවස්ථාවක් නම් කිරීමට අපහසුතා දක්වයි. |
| | 2.4.2 | රාහුල පොඩි හාමුදුරුවන්ගේ කතාව ඇසුරෙන් ලබාගත් ආදර්ශයක් ප්‍රකාශ කරයි | රාහුල පොඩි හාමුදුරුවන්ගේ කතාව ඇසුරෙන් ලබාගත් ආදර්ශයක් ප්‍රකාශ කිරීමට අපහසුතා දක්වයි |

# සංකල්පය - චරිත සංවර්ධනය
# 3 පාඩම - මිහිරි වචන කතා කරමු

බෝසත් ගිරවා තාපසවරුන්ගේ ඇසුර නිසා ප්‍රිය වචන කතා කරන යහපත් හැසිරීම ප්‍රදර්ශනය කළ බවත්, අනෙක් ගිරවා නරක මිනිසුන්ගේ ඇසුර නිසා නරක වචන කතා කරමින් අයහපත් හැසිරීම ප්‍රදර්ශනය කළ බව, සත්තිගුම්භ ජාතක කතාව ඇසුරෙන් පහදා දෙමින් යහපත් ඇසුරට සිසුන් යොමු කිරීම මෙන් ම යහපත් වචන කතා කිරීමට යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිතය.

**ඉගෙනුම් පලඃ**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2.0 බුද්ධ චරිතය / ජාතක කතා /චරිතාපදාන /උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග චරිතායනය කරයි. | සත්තිගුම්භ ජාතක කතාව | 2.3 ජාතක කතාවලට සවන් දී ප්‍රතිචාර දක්වයි. | 2.3.1 අවධානයෙන් සවන් දීම<br>2.3.2 නිවැරදි ප්‍රතිචාර දැක්වීම<br>2.3.3 කතන්දර/ සිද්ධි විස්තර කිරීම<br>2.3.4 ආදර්ශ ප්‍රකාශ කිරීම<br>2.3.5 ආදර්ශ අනුව හැසිරීම |

**ඉගෙනුම් සම්පත්**

- සත්තිගුම්බ ජාතක කථාව ඇතුළත් වීඩියෝ පට හා පින්තූර

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**ක්‍රියාකාරකම 1**

පියවර 1 :

- සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කරමින් සත්තිගුම්බ ජාතක කථාව සිසුන්ට කියා දෙන්න. මේ සඳහා ක්‍රියාකාරකම් පොතේ ඇතුළත් රූප රාමු යොදාගත හැකිය. ඒ සඳහා පහත දැක්වෙන කතාන්දරය ද යොදා ගන්න. (පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් - 1 ශ්‍රේණිය, 1 වාරය 'අපේ උරුමය' තේමාව යටතේ ද මෙම ජාතක කතාව ඇතුළත් කර ඇත.)

**සත්තිගුම්බ ජාතකය - 495**

කැලේ ගසක ගිරා කුඩුවක ගිරා අම්මා, තාත්තා හා පැටවු දෙන්නෙකු සිටියා. (සත්තිගුම්භ හා පුප්ඵක ගිරවුන් දෙදෙනාගේ නම් වේ.) අම්මයි, තාත්තයි කෑම හොයන්න ගිය වෙලාවේ මහා සුළඟක් ආවා. ගිරා පැටවුන් දෙන්නා සුළඟේ ගසාගෙන ගියා. කන්දේ දෙපැත්තට දෙන්නා වැටුණා. එක් පැටියකු සොරුන් ළඟට වැටුණා. අනෙක් පැටියා තවුසන් සිටින අසපුවක් ළඟට වැටුණා.

දවසක් දඩයමේ ආ රජ කෙනෙකු කැලයේ අතරමං වුණා. වෙහෙස නිසා රජතුමා ගසක් යට නිදා ගත්තා. ''අල්ලපියවු, මරපියවු, කොටපියවු, ගහපියවු'' ලෙස කෑගසනවා රජතුමාට ඇසුණා. රජතුමා එය අසා ඉක්මන් කරලා කන්දේ අනෙක් පැත්තට ගියා.

''එන්න පින්වත, ඔබට මහන්සි ඇති නේද? මේ පැන් බොන්න. මේ පලතුරු කන්න'' ලෙස කතා කරන මිහිරි කටහඬක් රජතුමාට ඇසුණා. රජතුමා පුදුම වුණා. එක් ගිරවකු සැර පරුෂ ව කතා කළා. අනෙක් ගිරවා ආදරයෙන් කතා කළා. මේ ගැන අසල සිටි තාපසතුමන්ගෙන් ඇසුවා. ''පුදුම වෙන්න එපා රජතුමනි. මේ ගිරවු දෙදෙනා එක ම දෙමාපියන්ගේ දරුවෝ. එක ම කුඩුවේ හැදුණෙ. සුළඟට හසු ව දෙදෙනා දෙපැත්තට වැටුණා. හොඳ ඇසුර නිසා මේ ගිරවා හොඳ අයකු වුණා. නරක ඇසුර නිසා ඒ ගිරවා නරක අයකු වුණා. ඇසුර හැමෝම වෙනස් කරනවා'' තාපසතුමා කීවා.

(පන්සිය පනස් ජාතක පොත - 495)

පියවර 2 :

- බෝසත් ගිරවා තාපසවරුන්ගේ ඇසුර නිසා ප්‍රිය වචන කතා කරන යහපත් හැසිරීම ප්‍රදර්ශනය කළ බවත් අනෙක් ගිරවා නරක ඇසුර නිසා නරක වචන කතා කරන අයහපත් හැසිරීම ප්‍රදර්ශනය කළ බවත් ක්‍රියාකරකම් පොතේ සඳහන් කතාව ඇසුරින් තහවුරු කරන්න.

**ක්‍රියාකාරකම 2**

පියවර 1 :

- ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකාරකම 1- සත්තිගුම්බ ජාතක කථාවේ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නඟන්නට සිසුන්ව යොමු කරන්න. එක් එක් සිසුවා අඳින ලද චිත්‍රය පිළිබඳ අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දෙන්න,
- ජාතක කතාව නිවැරදි ව ඇතුළත් වීඩියෝ පට ද සුදුසු පරිදි පාඩමට යොදා ගන්න.

පියවර 2 :

- ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකාරකම 2- බෝසත් ගිරවා කී මිහිරි වචන ගුරුතුමිය සමග කියන්නටත් නිවැරදිව තිත් ඉරි මත ලියන්නටත් සිසුන් යොමු කරවන්න.
- යහපත් වචන ලියා සාරධර්ම ගසෙහි සුදුසු පරිදි රඳවන්නට සිසුන්ව යොමු කරන්න

**තක්සේරු නිර්ණායක**

| කාර්යසාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවයට පැමිණ ඇත | |
|---|---|---|---|
| | | මට්ටම 3 | මට්ටම 1 |
| 2.3 ජාතක කතා ඇසුරෙන් ආදර්ශ ලබා ගෙන ඒ අනුව හැසිරෙයි. | 2.3.1<br>2.3.2 | සත්තිගුම්බ ජාතක කතාවට ඉතා හොඳින් සවන් දී එහි සඳහන් චරිතයක් නම් කරයි. | සත්තිගුම්බ ජාතක කතාවෙහි සඳහන් චරිතයක් නම් කිරීමට අපහසුතා දක්වයි. |
| | | තාපසාරාමයට වැටුණු ගිරවා පැවසූ මිහිරි වචනයක් නිවැරදි ව කියයි. | තාපසාරාමයට වැටුණු ගිරවා පැවසූ මිහිරි වචනයක් කීමට අපහසුතා දක්වයි. |
| | 2.3.3 | සත්තිගුම්බ ජාතක කතාවෙහි සිත්ගත් අවස්ථාවක් චිත්‍රයට නඟා චිත්‍රය පිළිබඳ අදහසක් ප්‍රකාශ කරයි. | සත්තිගුම්බ ජාතක කතාවෙහි සිත්ගත් අවස්ථාවක් චිත්‍රයට නඟා චිත්‍රය පිළිබඳ අදහසක් ප්‍රකාශ කිරීමෙහි අපහසුතා දක්වයි. |
| | 2.3.4<br>2.3.5 | පන්තිකාමරයේ දී සැමවිටම ප්‍රිය වචන කතා කිරීමට යොමු වෙයි. | පන්තිකාමරයේ දී ප්‍රිය වචන කතා කිරීමට උනන්දුවක් නොදක්වයි. |

# සංකල්පය - සමාජ සංස්කෘතික සංවේදීතාවය
# 4 පාඩම - සම්බුදු තෙමඟුල සමරමු

වෙසක් පොහෝ දිනයේ විශේෂත්වය පිළිබඳ ව පහදා දීමත් සම්බුදු තෙමඟුල සැමරීම පිණිස සිල් ගැනීම, දන්දීම ආදී බොහෝ පින්කම් සිදු කරන බවත්, වෙසක් පහන් කූඩු, කොඩිවැල්, තොරණ ආදියෙන් රාත්‍රි කාලය විචිත්‍ර වන අන්දමත් අවධානයට ලක් කිරීම අරමුණු කෙරේ.

**ඉගෙනුම් පල:**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 4.0 ආගමික හා සංස්කෘතික උත්සවවලට සහභාගී වී අත්දැකීම් ලබයි | සම්බුදු තෙමඟුල | 4.1 සුවිශේෂ ආගමික උත්සවයකට/ වැඩසටහනකට ක්‍රියාකාරී ව සහභාගී වෙයි. | 4.1.1 කැමැත්තෙන් සහභාගී වීම<br>4.1.2 ක්‍රියාකාරකම්වල නිරත වීම<br>4.1.3 අද්දැකීම් ප්‍රකාශ කිරීම |

**ඉගෙනුම් සම්පත්**

- පරිසරයේ සුන්දරත්වය ගැන කියවෙන සරල කවි, ගී
- සම්බුදු තෙමඟුලට අදාළ පින්තූර
- වෙසක් තොරණ සෑදීමට අවශ්‍ය දේ
- වෙසක් උත්සවය සැමරීමට අවශ්‍ය දේ

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**ක්‍රියාකාරකම** 1 -

පියවර 1

- වෙසක් මාසයේ පරිසරයේ සුන්දරත්වය නිරීක්ෂණය කරන්නට සිසුන්ව යොමු කරන්න.
- නිරීක්ෂණයේ දී තමා දුටු සිත් ගත් දේවල් පිළිබඳ කතාබහ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- පරිසරයේ සුන්දරත්වය ගැන කියවෙන සරල කවි, ගී ගායනා කරන්න.
- බෞද්ධයන්ට වෙසක් පොහොය දිනය වැදගත්වන අයුරු පහදා දෙන්න

පියවර 2

- ක්‍රියාකරකම් පොතේ පාඩම ඇසුරෙන් බෝසත් උපත හා සම්බන්ධ අසිරිමත් සිදුවීම් පිළිබඳ සාකච්ඡා කරන්න
- සිදුහත් කුමරුගේ මව මහාමායා දේවිය බවත්, පියා සුද්ධෝදන රජතුමා බවත් කියා දෙන්න
- සිදුහත් බෝසතාණන් වහන්සේ ජය ශ්‍රී මහා බෝ සෙවනේදී බුදු බවට පත්වූ බව කියා දෙන්න
- බුදුරජාණන් වහන්සේ මල්ල රජ දරුවන්ගේ උපවත්තන සල් උයනේදී පිරිනිවන් පෑ බව කියා දෙන්න

පියවර 3

- ඉපදීම, බුදුවීම හා පිරිනිවන් පෑම යන අවස්ථා තුන සම්බුදු තෙමඟුල බව කියා දෙන්න. (මේ සඳහා සුදුසු දෘශ්‍යාධාර යොදා ගන්න.)
- ක්‍රියාකරකම් පොතේ ක්‍රියාකරකම 1 සිදු කරන්න.
- තෙමඟුල සිහිපත් කරමින් වෙසක් පෙහොය නිමිති කරගෙන කරන පින්කම් මොනවාදැයි සාකච්ඡා කරන්න.
- වෙසක් පෙහොය නිමිති කරගෙන කළ හැකි පින්කම් මොනවාදැයි සිසුන්ගෙන් විමසන්න.
- ක්‍රියාකාරකම් පොතේ 04 පාඩමෙහි ක්‍රියාකාරකම 2 සිදු කරන්න.

**ක්‍රියාකාරකම** 2 -

පියවර 1 :

- කණ්ඩායම් වශයෙන් හෝ පන්ති මට්ටමින් තෙමගුල සිහිපත් කෙරෙන අවස්ථා දරුවන් ලවා චිත්‍රයට නංවන්න.
- මේ සඳහා ක්‍රියාකරකම් පොතේ 04 පාඩමෙහි ක්‍රියාකාරකම 3 සිදු කරන්න.
- එම චිත්‍ර ඇසුරින් 'පුංචි අපේ වෙසක් තොරණ' නමින් තොරණක් සැදීමට සිසුන්ට පහසුකම් සපයා දෙන්න.

පියවර 2 :

- වෙසක් උත්සවය සැමරීම නිමිතිකරගෙන වෙසක් සතිය තුළ පහත ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවන්න.
  - වෙසක් සැරසිලි
  - වෙසක් කූඩු සකස් කිරීම
  - පන්සල් යාම
  - ශීල සමාදාන වැඩසටහන්
  - නිර්මාණ ප්‍රදර්ශනය කිරීම ආදිය

**තක්සේරු නිර්ණායක**

| කාර්යසාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවයට පැමිණ ඇත | ප්‍රවීණතා මට්ටමෙන් දුරස්ථය |
|---|---|---|---|
| | | මට්ටම 2 | මට්ටම 1 |
| 4.1 සුවිශේෂ ආගමික උත්සවයකට/ වැඩසටහනකට ක්‍රියාකාරී ව සහභාගී වෙයි. | 4.1.1<br>4.1.2<br>4.1.3 | සම්බුදු තෙමගුල නිවැරදිව හා පිළිවෙළින් නම් කරයි | සම්බුදු තෙමගුල නිවැරදිව හා පිළිවෙළින් නම් කිරීමට අපහසුතා දක්වයි |
| | | සම්බුදු තෙමගුල සිහිකර කළ පින්කමක් නම් කර එය චිත්‍රයට නඟයි. | සම්බුදු තෙමගුල සිහිකර කළ පින්කමක් නම් කිරීමට අපහසුතා දක්වයි. |
| | | වෙසක් උත්සවය සැමරීම නිමිතිකරගෙන සාමූහික ව එකතු වී නිර්මාණ සකස් කරයි. | වෙසක් උත්සවය සැමරීම නිමිතිකරගෙන සාමූහික ව එකතු වී නිර්මාණ සකස් කිරීමට දායකත්වයක් නොදක්වයි. |

# සංකල්පය - සමාජ සංස්කෘතික සංවේදීතාවය
# 5 පාඩම - සාදු සාදු පෙරහර යමු

පෙරහර අපේ සංස්කෘතික උරුමයක් බවත්, පෙරහරෙහි අංග ලක්ෂණ පෙන්වා දී ප්‍රයෝගික අත්දැකීම් ලබා ගැනීමට යොමු කිරීමත් මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**ඉගෙනුම් පල:**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 4.0 ආගමික හා සංස්කෘතික උත්සවවලට / වැඩසටහන්වලට සහභාගී වී අත්දැකීම් ලබයි | පෙරහර | 4.3 සුවිශේෂ ආගමික /සංස්කෘතික උත්සවයක්/ වැඩසටහනක් ආදර්ශනය කරයි | 4.3.1 නියමිත පරිදි සූදානම් වීම /සැරසීම<br>4.3.2 සහයෝගී ව ක්‍රියාකාරකම්වල නිරත වීම<br>4.3.3 නිර්මාණශීලී බව ප්‍රදර්ශනය කිරීම<br>4.3.4 අවස්ථානුකූල ව හැසිරීම<br>4.3.5 සුදුසු වදන් භාවිත කිරීම<br>4.3.6 අද්දැකීම් ප්‍රකාශ කිරීම |

**ඉගෙනුම් සම්පත්**

- පෙරහරක පින්තූරයක් හෝ සංයුක්ත තැටි
- බෞද්ධ කොඩි, මල්, සේසත්, මල් ගස්, කස, ටින් බෙර ආදී පෙරහරකට යොදා ගන්නා ආදේශ භාණ්ඩ හා උපකරණ, ආදර්ශ වැකි සහිත කොඩි

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

ක්‍රියාකාරකම 1

පියවර 1 :

- වෙසක්, පොසොන්, කඨින පෙරහර වැනි සිසුන් දැක ඇති බොදු පෙරහර පිළිබඳ ව විමසමින් ඒවා පිළිබඳ ව සාකච්ඡා කරන්න. (මහනුවර ඇසළ පෙරහර පැවැත්වෙන කාලය හෝ ඔබේ ප්‍රදේශයේ කිසියම් පෙරහැරක් සංවිධානය කෙරෙන කාලයක් වෙතොත් එම කාලය තුළ මෙම පාඩම යොදා ගන්න.)
- බොදු පෙරහර පිළිබඳ සාකච්ඡා කරමින්, අප බොදු පෙරහර පවත්වන්නේ බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය පුදන්නට බව සිසුන්ට අවධාරණය කරන්න.
- පෙරහරක පින්තූරයක් හෝ සංයුක්ත තැටි හෝ යොදා ගනිමින් පෙරහරක දක්නට ලැබෙන අංග මොනවා දැයි සිසුන්ගෙන් විමසමින් පෙරහරක අංග හඳුන්වා දෙන්න.
- මේ සඳහා ක්‍රියාකරකම් පොතේ පාඩම ද යොදාගන්න, එහි සඳහන් කවි තාලයට ගායනා කරන්න.

ක්‍රියාකාරකම 2

පියවර 1 :

- පන්ති මට්ටමින්/පාසල් මට්ටමින් සංවිධානය කර පෙරහරක් පවත්වන්න.
- පෙරහරට සූදානම් විය යුතු ආකාරය පිළිබඳ සිසුන් දැනුවත් කරන්න. (ඇඳුම්-පැළඳුම් රැගෙන ආයුතු දේවල් ආදිය)
- පෙරහරක් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සිසුන් ද සහභාගි කර ගනිමින් (අවශ්‍ය නම් දෙමාපියන්ගේ සහයෝගය ද ලබා ගෙන) නිර්මාණය කරන්න.
- කස, කොඩි, සේසත්, මල් ගස්, මල් වට්ටි, නැටුම් කණ්ඩායම් ඇතුළු බෞද්ධ පෙරහරකට ගැළපෙන අංග සිගිති පෙරහරට ඇතුළත් කර ගන්න.

පියවර 2 :
- දකින අයගේ ප්‍රසාදය ඇති වන ආකාරයෙන් පාසල් මට්ටමින් සිඟිති පෙරහරක් පවත්වන්න.
- ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකරකම 1 සඳහා සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 3**

පියවර 1 -
- පෙරහරක එක් එක් අංග චිත්‍රයට නැඟීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අඳින ලද චිත්‍ර කපා වෙන් කොට සුදුසු පරිදි කළු කඩදාසියක අලවා පෙරහරක් නිර්මාණය කරන්න.

පියවර 2 -
- පෙරහර චිත්‍රය පන්තිකාමරයේ ප්‍රදර්ශනය කරන්න.
- සිසු නිර්මාණ අගය කරන්න.
- සාමූහික ව ක්‍රියාකරකම් පොතේ ඇතුළත් කවි ගායනා කරන්න.

**ක්‍රියාකාරකම 4**

පියවර 1 -
- කුඩා සේසතක් සෑදීමට සියලු සිසුන් යොමු කරවන්න.
- නිර්මාණාත්මක ව කුඩා සේසතක් සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය සිසුන්ට සපයා දෙන්න. (ගුරුවරයාට අභිමත පරිදි සුදුසු ද්‍රව්‍ය යොදා ගත හැකිය)

  උදා; කාඩ්බෝඩ් රවුමක්, වියළි කොළ, ඉරටු, අයිස්ක්‍රීම් කෝටු ආදිය ද මේ සඳහා යොදාගත හැකිය.
- සිසුන් විසින් සකසන ලද සේසත ප්‍රදර්ශනය කරන්නට අවස්ථාව දෙන්න
- සිසු නිර්මාණ අගය කරන්න.

පියවර 2 -
- ක්‍රියාකරකම් පොතේ ක්‍රියාකාරකම 2- සේසත ලස්සනට පාට කරන්නට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න

**තක්සේරු නිර්ණායක**

| කාර්යසාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවයට පැමිණ ඇත | ප්‍රවීණතා මට්ටමෙන් දුරස්ථය |
|---|---|---|---|
| | | මට්ටම 2 | මට්ටම 1 |
| 4.3 සුවිශේෂ ආගමික/ සංස්කෘතික උත්සවයක් ආදර්ශනය කරයි. | 4.3.3 | සාමූහික ව එකතු වී පෙරහර සඳහා අවශ්‍ය ද්‍රව්‍ය නිර්මාණය කරයි. | සාමූහික ව එකතු වී පෙරහර සඳහා අවශ්‍ය ද්‍රව්‍ය නිර්මාණය කිරීමට උනන්දු නොවෙයි. |
| | 4.3.1 | පෙරහර සඳහා නියමිත පරිදි සූදානම් වෙයි./සැරසෙයි. | පෙරහර සඳහා නියමිත පරිදි සූදානම් නොවෙයි./නොසැරසෙයි. |
| | 4.3.2 | කැමැත්තෙන් යුතුව පෙරහරට සහභාගී වෙයි. | කැමැත්තෙන් යුතුව පෙරහරට සහභාගී වීමට උනන්දුවක් නොදක්වයි. |
| | 4.3.2 | දෙන ලද ද්‍රව්‍ය ඇසුරෙන් නිර්මාණාත්මක ව කුඩා සේසතක් සාදයි. | දෙන ලද ද්‍රව්‍ය ඇසුරෙන් නිර්මාණාත්මක ව කුඩා සේසතක් සෑදීමට දුෂ්කරතා පෙන්වයි. |
| | 4.3.3 | පෙරහරක එක් එක් අංග චිත්‍රයට නැඟීමට දායකත්වය දක්වයි. සුදුසු පරිදි අලවා පෙරහර නිර්මාණය කරයි. | පෙරහරක එක් එක් අංග චිත්‍රයට නගා සුදුසු පරිදි අලවා පෙරහර නිර්මාණය කිරීමට උනන්දුවක් නොදක්වයි. |

## සංකල්පය - සමාජ සංස්කෘතික සංවේදීතාවය
## 6 පාඩම - පුංචි අපේ මල් දන්සල

බෞද්ධ සංස්කෘතික අංගයක් වන දන්සල පිළිබඳව හඳුන්වා දෙමින් මල් දන්සලක් පවත්වා ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට සිසුන් යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

**ඉගෙනුම් පල:**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 4.0 ආගමික හා සංස්කෘතික උත්සවවලට සහභාගී වී අත්දැකීම් ලබයි | මල් දන්සල | 4.3 සුවිශේෂ ආගමික /සංස්කෘතික උත්සවයක්/ වැඩසටහනක් ආදර්ශනය කරයි | 4.3.1 නියමිත පරිදි සූදානම් වීම /සැරසීම<br>4.3.2 සහයෝගී ව ක්‍රියාකාරකම්වල නිරත වීම<br>4.3.3 නිර්මාණශීලී බව ප්‍රදර්ශනය කිරීම<br>4.3.4 අවස්ථානුකූල ව හැසිරීම<br>4.3.5 සුදුසු වදන් භාවිත කිරීම<br>4.3.6 අද්දැකීම් ප්‍රකාශ කිරීම |

**ඉගෙනුම් සම්පත්**
- දන්සලට අවශ්‍ය මල්
- මල් දැමීමට කොළවලින් (කෙසෙල් කොළ, කැන්ද කොළ, තේක්ක කොළ, ආදී) සෑදූ ගොටු හෝ කඩදාසි කවර/ කඩදාසි වට්ටි
- මල් මිටි බැඳීමට පටි

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

**ක්‍රියාකාරකම 1**

පියවර 1
- දන්සල යනු කුමක්දැයි සිසුන්ට හඳුන්වා දෙන්න.
- ඈත අතීතයේ සිටම බෞද්ධයන් විවිධාකාර දන්සල් පවත්වා ඇති බව සාකච්ඡා කරන්න. (ආහාරපාන,වස්ත්‍ර, ජීවත්වීමට අවශ්‍ය දේවල්)
- වන්දනාවේ යන පිරිස් සඳහා විවිධ දේවල් සැපයීම (ආහාර, බීම වර්ග, ඖෂධ පැන් ආදී) දන්සල් මගින් කරන බව පහදා දෙන්න.

පියවර 2
- මල් දන්සලක වටිනාකම සාකච්ඡා කරන්න.
- මල් ඉතා පිරිසිදුවට නෙළා ගැනීම, ඉක්මනින් පර නොවෙන මල් මේ සඳහා යොදා ගැනීම, පරවීමට පෙර බෙදා දීම වැනි කරුණු අවධාරණය වන ලෙස සාකච්ඡාව මෙහෙයවන්න.
- දන්සල් දීම නිසා සිත් පහන්වන බවත්, සිත් සතුටට පත්වන බවත් පහදා දෙන්න.
- දන්සල පැවැත්වීමට පෙර දෙමාපියන් දැනුවත් කරන්න.
- මල් දන්සල පවත්වන දිනය, ස්ථානය, වේලාව, සුදුසු ස්ථානවල ප්‍රදර්ශනය කරන්න.
- වැව, ඇල, දොළවල මල් නෙළීම දෙමාපියන් හෝ වැඩිහිටියන් විසින් ඉතා ආරක්ෂාකාරීව කළයුතු බව දැනුවත් කරන්න.
- සිසුන්ට පහසුවෙන් නෙළාගත හැකි මල් රැස් කර ගැනීම සඳහා උපදෙස් දෙන්න.
- මල් ගසට ද අන් අයට ද ඉතිරි කර මල් නෙළා ගත යුතු බව පහදා දෙන්න.
- ක්‍රියාකාරකම් පොතේ අදාළ පාඩමෙහි කවි ගායනා කරන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.
- සාකච්ඡාවක නිරතවන්න.

**ක්‍රියාකාරකම 2 - මල් දන්සල පැවැත්වීම**

**පියවර 1**

- සිසුන් දන්සලට රැස්කර ගත් මල් පාසලට ගෙන්වා ගන්න (දෙමාපියන්ගේ, වැඩිහිටියන්ගේ උදවු ලබාගන්න)
- තෝරා ගත් ස්ථානයේදී සිසුන් සහභාගී කර ගනිමින් මල් දන්සල සකස් කර ගන්න.
- සියලු දෙනාගේ ප්‍රසාදය ඇතිවන ආකාරයට මල් දන්සල පවත්වන්න
- සෑම සිසුවෙක්ම ශ්‍රද්ධාවෙන් යුක්තව ක්‍රියාකාරකම්වල නිරත කරවන්න
- සෑම දෙනාගේම සිත සතුටුවන පරිදි ආචාරශීලීව කතා කරන්නටත් තෙරුවන් සරණයි!, පින් සිදුවේවා! වැනි වචන භාවිත කරන්නට සිසුන්ව යොමු කරන්න.

**පියවර 2**

- සිසු සහභාගිත්වය ඇති ව දන්සල පැවැත්වූ ස්ථානය පිරිසිදු කරන්න
- කොඩි, සැරසිලි යොදා ගත්තේ නම් ඒවා ද ඉවත් කරන්න.

**ක්‍රියාකාරකම 3**

**පියවර 1 -**

- ක්‍රියාකාරකම් පොතේ කවි ගායනා කරන්නට නැවතත් සිසුන්ට අවස්ථාව දෙන්න.
- දන්සල පැවැත්වීමෙන් ලද සිසු අත්දැකීම් බෙදා ගැනීමට අවස්ථාව දෙන්න.
- ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකාරකම 1-2 සඳහා සිසුන්ව යොමු කරන්න

**තක්සේරු නිර්ණායක**

| කාර්යසාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවයට පැමිණ ඇත | ප්‍රවීණතා මට්ටමෙන් දුරස්ථය |
|---|---|---|---|
| | | මට්ටම 2 | මට්ටම 1 |
| 4.3 සුවිශේෂ ආගමික /සංස්කෘතික උත්සවයක්/ වැඩසටහනක් ආදර්ශනය කරයි | 4.3.3 | සාමූහික ව එකතු වී මල් දන්සල සඳහා අවශ්‍ය ද්‍රව්‍ය රැස් කරයි | සාමූහික ව එකතු වී මල් දන්සල සඳහා අවශ්‍ය ද්‍රව්‍ය රැස් කිරීමට උනන්දු නොවෙයි |
| | 4.3.1 | මල් දන්සල සඳහා නියමිත පරිදි සූදානම් වෙයි. | මල් දන්සල සඳහා නියමිත පරිදි සූදානම් නොවෙයි. |
| | 4.3.2 | කැමැත්තෙන් යුතුව මල් දන්සලට සහභාගී වෙයි. | කැමැත්තෙන් යුතුව මල් දන්සලට සහභාගී වීමට උනන්දුවක් නොදක්වයි. |
| | 4.3.2 | මල් දන්සල පැවැත්වීමෙන් අනතුරුව පිරිසිදු කිරිම සඳහා කැමැත්තෙන් දායක වෙයි. | මල් දන්සල පැවැත්වීමෙන් අනතුරුව පිරිසිදු කිරිම සඳහා කැමැත්තෙන් දායක නොවෙයි. |

## සංකල්පය - ආචාරධර්ම, සාරධර්ම හා සම්මතයන
## 7 පාඩම - තෙරුවන් නමදිමු

දිනපතා තෙරුවන් වන්දනා කිරීම බොදු දරුවෙකුගේ යහ පුරුද්දක් වශයෙන් පවත්වාගෙන යාමට හුරු කිරීම මෙයින් අපේක්ෂිත ය.

**ඉගෙනුම් පල:**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 6.0 ආගමික වතාවත්වල නිරතවීමේදී නිවැරදි වත් පිළිවෙත්, සිරිත් විරිත් හා ඉරියව් ප්‍රදර්ශනය කරයි | තෙරුවන් නැමදීම | 6.1 ආගමික වතාවත්වල නිරතවීමේ දී නිවැරදි වත් පිළිවෙත්වල යෙදෙයි | 6.1.1 නිවැරදි වත් පිළිවෙත්වල යෙදීම |
| | | 6.2 ආගමික වතාවත්වල නිරතවීමේ දී නිවැරදි සිරිත් විරිත් අනුගමනය කරයි | 6.2.1 නිවැරදි සිරිත් විරිත් අනුගමනය කිරීම |
| | | 6.3 ආගමික වතාවත්වල නිරතවීමේ දී නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කරයි | 6.3.1 නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කිරීම |
| | | 6.4 ආගමික කටයුතුවලදී අදාළ නිවැරදි වචන භාවිත කරයි | 6.4.1 නිවැරදි වචන භාවිත කිරීම |

**ඉගෙනුම් සම්පත් :**

- තෙරුවන් නැමදීම ප්‍රදර්ශනය කෙරෙන රූප රාමු හෝ වීඩියෝ පට

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

ක්‍රියාකාරකම 1 -

පියවර 1 :

- තෙරුවන් නැමදීම ප්‍රදර්ශනය කෙරෙන රූප රාමු හෝ වීඩියෝ පට යොදා ගනිමින් තෙරුවන් වන්දනා කරන ආකාරය පිළිබඳ සිසුන්ට අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දෙන්න.
- තෙරුවන් නැමදීම සඳහා තම තමන් සූදානම් වන ආකාරය සිසුන්ගෙන් විමසන්න.
- සියලුම සිසුන්ට අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 2 :

- සිසු අදහස් ද සැලකිල්ලට ගනිමින් තෙරුවන් වන්දනාවට සූදානම් විය යුතු ආකාරය ක්‍රියාකාරකම් පොතේ 'තෙරුවන් නමදිමු' පාඩම ඇසුරු කර ගෙන තවදුරටත් සිසුන්ට පහදා දෙන්න.
- ඒ ඇසුරෙන් පවුලේ සියලු දෙනාගේ ම සහභාගීත්වයෙන් යුතුව තෙරුවන් වන්දනා කිරීමේ වැදගත්කම සිසුන්ට පහදා දෙන්න.
- නමස්කාර පාඨය කියන විට දොහොත් මුදුනේ තබා තිසරණ සරණ යන ආකාරය ආදර්ශනය කර පෙන්වන්න.
- තිසරණ සහිත පන්සිල් සමාදන් වීමේ නිවැරදි ඉරියවු ආදර්ශනය කර පෙන්වන්න. (මේ සඳහා රූප රාමු භාවිතය/අනුකරණය යොදාගත හැකි ය.)

පියවර 3 :

- පාඩමේ සඳහන් ශාසනික වචන පිළිබඳ සිසුන්ට පහදා දෙන්න.

**තක්සේරු නිර්ණායක**

| කාර්යසාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවයට පැමිණ ඇත | ප්‍රවීණතා මට්ටමෙන් දුරස්ථය |
|---|---|---|---|
| | | මට්ටම 2 | මට්ටම 1 |
| 6.1 ආගමික වතාවත්වල නිරතවීමේ දී නිවැරදි වත් පිළිවෙත්වල යෙදෙයි. | 6.1.1 | තෙරුවන් නැමඳීම සඳහා තමන් සූදානම් වන ආකාරය ප්‍රකා කරයි. | තෙරුවන් නැමඳීම සඳහා තමන් සූදානම් වන ආකාරය ප්‍රකාශ කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |
| 6.2 ආගමික වතාවත්වල නිරතවීමේ දී නිවැරදි සිරිත් විරිත් අනුගමනය කරයි. | 6.2.1 | | |
| 6.3 ආගමික වතාවත්වල නිරතවීමේ දී නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කරයි. | 6.3.1 | නමස්කාර පාඨය කීමේ දී දොහොත් මුදුනේ තබා වන්දනා ඉරියව්ව ප්‍රදර්ශනය කරයි. | නමස්කාර පාඨය කීමේ දී දොහොත් මුදුනේ තබා වන්දනා ඉරියව්ව ප්‍රදර්ශනය කිරීමේ දුෂ්කරතා පෙන්වයි. |
| | | තිසරණ සහිත පන්සිල් සමාදන් වීමේ නිවැරදි ඉරියවු ආදර්ශනය කර පෙන්වයි. | තිසරණ සහිත පන්සිල් සමාදන් වීමේ නිවැරදි ඉරියවු ආදර්ශනය කර පෙන්වීමේ දුෂ්කරතා දක්වයි. |
| 6.4 ආගමික කටයුතුවල දී අදාළ නිවැරදි වචන භාවිත කරයි. | 6.4.1 | අවස්ථානුකූල ව ශාසනික වචන නිවැරදි ව පවසයි. | අවස්ථානුකූල ව ශාසනික වචන පැවසීමට දුෂ්කරතා දක්වයි. |

# බුද්ධ ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

1 ශ්‍රේණිය

තුන්වන වාරය

## සංකල්පය - චරිත සංවර්ධනය
## 1 පාඩම - මහා කාරුණික බුදු සමිඳු

බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය හෙළි වන සෝපාක පොඩි හාමුදුරුවන්ගේ කතා පුවත සිසුන්ගේ සිත් තුළ කාරුණික ගුණය ජනිත කිරීම සඳහා භාවිත කිරීම අපේක්ෂා කෙරේ.

**ඉගෙනුම් පලඃ**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2.0 බුද්ධ චරිතය /ජාතක කතා /චරිතාපදාන /උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග චරිතායනය කරයි. | සෝපාක පොඩි හාමුදුරුවන්ගේ කතාව<br><br>මහා කරුණාව | 2.5 ආගමික චරිතාපදාන ඇසුරෙන් ලබාගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.5.1 අවධානයෙන් සවන්දීම<br><br>2.5.2 ආදර්ශ ප්‍රකාශ කිරීම |

**ඉගෙනුම් සම්පත්**
- සෝපාක පොඩි හාමුදුරුවන්ගේ කතන්දරය ඇතුළත් වීඩියෝ පට (ඇත්නම්)
- සෝපාක පොඩි හාමුදුරුවන්ගේ කතන්දරයට අදාළ රූප රාමු

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

ක්‍රියාකාරකම 1

පියවර 1 ඃ
- සුදුසු ආකාරයට සෝපාක පොඩි හාමුදුරුවන්ගේ කතන්දරය සිසුන්ට ඇසීමට/ නැරඹීමට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් පාඩම ද ඇසුරු කර ගනිමින් සෝපාක පොඩි හාමුදුරුවන්ගේ කතන්දරය කියා දෙන්න.
- සෝපාක පොඩි හාමුදුරුවන්ගේ කතාව ඇසුරින් බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය පිළිබඳ විස්තර කරන්න.
- අප සතු ව කරුණා ගුණය ඇතත් බුදුරජාණන් වහන්සේ තුළ ඇත්තේ මහා කරුණා ගුණය බව තහවුරු කරන්න.

ක්‍රියාකාරකම 2

පියවර 1 ඃ
- ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 1 - සෝපාක පොඩි හාමුදුරුවන්ගේ කතන්දරය මතකයෙන් කියන්නට සිසුන්ව යොමු කරන්න.
- එක් එක් සිසුවාට කතන්දරය මතකයෙන් කියන්නට අවස්ථාව ලබා දෙන්න.

පියවර 2 ඃ
- ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 2හි සෝපාක පොඩි හාමුදුරුවන්ගේ කතන්දරයෙහි සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නඟන්නට සිසුන්ව යොමු කරන්න.
- බුදුරජාණන් වහන්සේ හා සෝපාක හමුව දෙබසක් ලෙස ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

**තක්සේරු නිර්ණායක**

| කාර්යසාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවයට පැමිණ ඇත | ප්‍රවීණතා මට්ටමෙන් දුරස්ථය |
|---|---|---|---|
| | | මට්ටම 2 | මට්ටම 1 |
| 2.4 ආගමික චරිතාපදාන ඇසුරෙන් ලබාගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.4.1 | සෝපාක පොඩි හාමුදුරුවන්ගේ කතන්දරයට අවධානයෙන් සවන් දී අසනු ලබන ප්‍රශ්නවලට නිවැරදි ව පිළිතුරු දෙයි. | සෝපාක පොඩි හාමුදුරුවන්ගේ කතන්දරයට අවධානයෙන් සවන් දී ප්‍රතිචාර නොදක්වයි. |
| | | කතාවෙහි සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නඟා චිත්‍රය පිළිබඳ අදහසක් ප්‍රකාශ කරයි. | කතාවෙහි සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නඟා චිත්‍රය පිළිබඳ අදහසක් ප්‍රකාශ කිරීමට අපහසුතා දක්වයි. |
| | 2.4.2 | තමන් විසින් කරුණාවෙන් තව කෙනෙකුට පිහිට වූ අවස්ථාවක් ප්‍රකාශ කරයි. | තමන් විසින් කරුණාවෙන් තව කෙනෙකුට පිහිට වූ අවස්ථාවක් ප්‍රකාශ කරන්නට අපහසුතා දක්වයි. |

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- කාරුණික ව කතාබහ කිරීම හා කාරුණික ව උදවු උපකාර කිරීම

## සංකල්පය - චරිත සංවර්ධනය
## 2 පාඩම - මල්වියන් බැඳී සුමන මල්කරු

පින්කම් කිරීම සැපවත් ජීවිතයකට හේතු වන බව සුමන මාලාකරුගේ චරිතයෙන් පැහැදිලි කර දී සිසුන් ද කුඩා කල සිට ම පින්කම්හි නිරත කරවීමට යොමු කිරීම මෙම පාඩමේ අරමුණ වේ.

**ඉගෙනුම් පල:**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2.0 බුද්ධ චරිතය /ජාතක කතා /චරිතාපදාන /උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග චරිතායනය කරයි. | සුමන මාලාකරුගේ කතාව | 2.5 ආගමික චරිතාපදාන ඇසුරෙන් ලබාගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.5.1 අවධානයෙන් සවන්දීම<br>2.5.2 ආදර්ශ ප්‍රකාශ කිරීම |

**ඉගෙනුම් සම්පත්**

- සුමන මාලාකරු ගැන කියවෙන ක්‍රියාකාරකම් පොතේ කතන්දරය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**ක්‍රියාකාරකම 1**

පියවර 1 :
- සුමන මාලාකරු පිළිබඳ මූලික තොරතුරු සිසුන්ට කියා දෙන්න.
- සුමන මාලාකරු යනු කවුරුන් දැයි විමසමින් සිසුන්ට හඳුන්වා දෙන්න.
- සුමන මාලාකරු ගැන කියවෙන ක්‍රියාකාරකම් පොතේ ඇති කතන්දරය සිසුන් සමග කියවන්න.

### සුමන මාලාකරුගේ කතාව

බිම්බිසාර මහ රජතුමාට දිනපතා මල් සපයන 'සුමන' නමින් මල්කරුවෙක් වෙයි. සපයන මල් වෙනුවෙන් සැම දිනකට ම රන් කාසි 8ක් ඔහුට රජ ගෙදරින් ලැබේ. එක් දිනක් වනයට ගොස් වෙහෙස ව නෙළා ගත් මල් රජුට ගෙන යන අතරතුර දී බුදුරජාණන් වහන්සේ සමග වඩින මහා සංඝරත්නය හමු වේ. සුමන මාලාකරු ශ්‍රද්ධාවෙන් පිනා යයි. දන් දීමට තමන් සතු ව මල් හැර කිසිවක් නැති කල රජුන් වෙත ගෙන යෑමට සකස් කළ සියලු මල් ඔහු විසින් බුදුරජාණන් වහන්සේ ඇතුළු මහා සංඝරත්නයට දන් දෙන ලදි. මල් පූජා කරන ලදි. සුමන පිදූ ඒ සුවඳ මලින් බුදුන් වහන්සේ වටා මල් වියනක් සැදේ. බුදුන් වහන්සේ මල් වියන තුළින් රජගහ නුවර වීදියට වඩින්නට විය. එය දුටු සැදැහැති මිනිස්සු සාධුකාර පැවැත්වූහ.

සාධුකාර හඬ ඇසූ බිම්බිසාර රජතුමා ද සැදැහැ සිතින් බුදුන් වහන්සේ ඉදිරියට පැමිණෙයි. බුදු රජාණන් වහන්සේ වන්දනා කරයි. අසල සිටි සුමන මාලාකරු දැක රජතුමා ඔහු කැඳවයි. සුමන කළ පින්කම ගැන අසා රජතුමා සතුටු වෙයි. දුප්පත් සුමනට භවභෝග සැප සම්පත් ලබා දෙයි. සුමන සතුටට පත් වෙයි. මල් දන් දුන් පිනෙන් සුමන මියගොස් අනාගතයේ දී පසේ බුදුවරයකු බවට පත් වී පිරිනිවනට පත් වන බව කියවේ.

(වැඩිදුර භාවිතය සඳහා සද්ධර්ම රත්නාවලිය - කිරිඇල්ලේ ඤාණවිමල හිමි - පිටු අංක - 465 - එම්. ඩී. ගුණසේන ප්‍රකාශකයෝ)

**ක්‍රියාකාරකම 2**

**පියවර 1 :**

- ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 1 සුමන මාලාකරුගේ කතන්දරයේ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නඟන්නට සිසුන් යොමු කරන්න. අඳින ලද චිත්‍රය ගැන පවසන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ක්‍රියාකාරකම් පොතෙහි සඳහන් ක්‍රියාකාරකම 2 - කතන්දරය මතකයෙන් පවසන්නට සිසුන් යොමු කරන්න.

**තක්සේරු නිර්ණායක**

| කාර්යසාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවයට පැමිණ ඇත | ප්‍රවීණතා මට්ටමෙන් දුරස්ථය |
|---|---|---|---|
| | | මට්ටම 2 | මට්ටම 1 |
| 2.4 ආගමික චරිතාපදාන ඇසුරෙන් ලබාගත හැකි ආදර්ශ ප්‍රකාශ කරයි. | 2.4.1 | සුමන මාලාකරුගේ කතාවට අවධානයෙන් සවන් දී අසනු ලබන ප්‍රශ්නවලට නිවැරදි ව පිළිතුරු දෙයි. | සුමන මාලාකරුගේ කතාවට අවධානයෙන් සවන් දී ප්‍රතිචාර නොදක්වයි. |
| | | පින්තූර ගළපා සුමන මාලාකරුගේ කතන්දරය නිවැරදිව කියයි. | පින්තූර ගළපා සුමන මාලාකරුගේ කතන්දරය නිවැරදිව කියන්නට අපහසුතා දක්වයි. |

## සංකල්පය - චරිත සංවර්ධනය
## 3 පාඩම - ගී ගයමු යහ ගුණ උගනිමු

**සිරිත් මල්දමෙහි ඇතුළත් කවි ඇසුරින් හොඳ ගුණ දම් පුරුදු පුහුණු කර ගෙන ආදර්ශවත් ජීවිතයක් ගොඩනගා ගැනීමට යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.**

**ඉගෙනුම් පල:**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 2.0 බුද්ධ චරිතය / ජාතක කතා /චරිතාපදාන /උපදේශ කාව්‍ය ඇසුරෙන් චරිත සංවර්ධනයට අදාළ සුවිශේෂ ගුණාංග චරිතායනය කරයි. | සිරිත් මල්දමෙහි අදාළ කවි | 2.5 උපදේශ කාව්‍යකට සවන් දී තාලයට ගායනා කරයි. | 2.5.1 අවධානයෙන් සවන් දීම<br>2.5.2 නිවැරදි ප්‍රතිචාර දැක්වීම<br>2.5.3 කතන්දර/සිද්ධි විස්තර කරීම |
| | | 2.6 උපදේශ කාව්‍යක් ඇසුරෙන් ලබාගත හැකි ආදර්ශ ප්‍රකාශ කර ඒ අනුව හැසිරෙයි. | 2.6.1 ආදර්ශ ප්‍රකාශ කිරීම<br>2.6.2 ආදර්ශ අනුව හැසිරීම |

**ඉගෙනුම් සම්පත්**
- සිරිත් මල්දම පොත/සංයුක්ත තැටි

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

ක්‍රියාකාරකම 1

පියවර 1

- ක්‍රියාකාරකම් පොතේ සඳහන් පහත දැක්වෙන කවියට හොඳින් සවන් දීමට සිසුන් යොමු කර තාලයට ගායනා කරන්න.

**අතපය සෝද ගෙන**
**නරක කෑමක් නොම ගෙන**
**හොඳ දෙයක් කෑමෙන**
**සැරසෙන්න පාසලට යන මෙන**

(සිරිත් මල්දම - 26 කවිය - ඇම්. ඇල්. සිල්වා ගුරු මුහන්දිරම්)

- කවියේ අදහස සිසුන්ට පැහැදිලි කර දෙන්න.

තේරුම -
අත් පා සෝදා පිරිසිදු වී, නරක (අපිරිසිදු, නරක් වූ) ආහාරයක් නොගෙන, හොඳ ආහාරයක් අනුභව කොට පාසලට යාමට සූදානම් වන්න.

- කවියේ අදහස මතු කර ඒ අනුව උදෑසන ආහාර ගෙන පාසලට යාමට සූදානම් විය යුතු බව සිසුන්ට පහදා දෙන්න.

**ක්‍රියාකාරකම 2**

**පියවර 1**

- හොඳ ගුණ දම් පුරුදු පුහුණු කර ගෙන ආදර්ශවත් ජීවිතයක් ගොඩනගා ගැනීමේ අගය සිසුන්ට පහදා දෙන්න.
- සාමූහිකව තාල තබමින් ඉහත කවිය ගායනා කිරීමට සිසුන්ව යොමු කරන්න
- එම කවිය වනපොත් කිරීමට සිසුන්ව යොමු කරන්න.
- එක් එක් සිසුවාට කවිය ගායනය කර කවියෙහි තේරුම සරල ව පවසන්නට අවස්ථාව දෙන්න.

**පියවර 2**

- ක්‍රියාකාරකම් පොතේ සඳහන් 'පින්තූර බලා හොඳ සිරිත් පවසන්නට' සිසුන්ව යොමු කරන්න.

**තක්සේරු නිර්ණායක**

| කාර්යසාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවයට පැමිණ ඇත | ප්‍රවීණතා මට්ටමෙන් දුරස්ථය |
|---|---|---|---|
| | | මට්ටම 2 | මට්ටම 1 |
| 2.5 උපදේශ කාව්‍යකට සවන් දී තාලයට ගායනා කරයි. | 2.5.1 | සිරිත් මල්දමෙහි අදාළ කවිය තාලයට ගායනා කරයි. | සිරිත් මල්දමෙහි අදාළ කවිය තාලයට ගායනා කිරීමට අපහසුතා දක්වයි. |
| | 2.5.2 | සිරිත් මල්දමෙහි අදාළ කවිය මතකයෙන් කියයි. | සිරිත් මල්දමෙහි අදාළ කවිය මතකයෙන් කීමට අපහසුතා දක්වයි. |
| 2.6 උපදේශ කාව්‍ය ඇසුරෙන් ලබාගත හැකි ආදර්ශ පවසයි. ඒ අනුව හැසිරෙයි. | 2.6.1 | සිරිත් මල්දමෙහි අදාළ කවියෙහි අන්තර්ගත උපදෙස් තම වචනයෙන් ප්‍රකාශ කරයි | සිරිත් මල්දමෙහි අදාළ කවියෙහි අන්තර්ගත උපදෙස් තම වචනයෙන් ප්‍රකාශ කිරීමට අපහසුතා දක්වයි. |

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- උපදේශ කාව්‍ය ඇසුරෙන් ලබා ගත් ආදර්ශ අනුව හැසිරීම.

## සංකල්පය - පාරිසරික සංවේදීතාවය
## 4 පාඩම - පන්තිය ලස්සන කරමු

පරිසරයට ආදරය කිරීම උතුම් ගුණාංගයක් බව බුද්ධ දේශනාවේ සඳහන් වේ. ඒ අනුව පරිසරයට සංවේදී වෙමින් තමා අවට මෙන් ම තම පන්තිකාමරය ද පිරිසිදුව හා පිළිවෙළට තබා ගැනීමට හුරු කිරීම මෙයින් අපේක්ෂා කෙරේ.

**ඉගෙනුම් පල:**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 8.0 තමා අවට පරිසරය පිරිසිදු කර අලංකාර ව පිළිවෙළකට තබා ගැනීමට කටයුතු කරයි. | පන්තිකාමර පරිසරයේ සුන්දරත්වය | 8.1 තමා අවට පරිසරය පිරිසිදු කිරීමට දායක වෙයි. | 8.1.1 ක්‍රියාකාරී ව සහභාගී වීම |
| | | 8.2 අවට පරිසරය අලංකාර ව පිළිවෙළකට තබා ගැනීමට කටයුතු කරයි. | 8.2.1 අදහස් ප්‍රකාශ කිරීම<br>8.2.2 නිර්මාණශීලී බව ප්‍රදර්ශනය කිරීම<br>8.2.3 උපකරණ භාවිත කිරීම<br>8.2.4 අගය කිරීම |

**ඉගෙනුම් සම්පත්**

- පරිසරයේ පිරිසිදුකම හා අපිරිසිදුකම පිළිවෙළ පෙන්වන රූප රාමු
- පරිසරයේ සුන්දරත්වය පිළිබඳ කියැවෙන ගීතයක්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

ක්‍රියාකාරකම 1

පියවර 1 :

- පරිසරයේ සුන්දරත්වය පිළිබඳ කියැවෙන ගීතයකට සවන් දීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඒ ඇසුරින් තමා අවට පරිසරය පිරිසිදුව හා පිළිවෙළකට තබා ගැනීමේ වැදගත්කම පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- පරිසරය අපිරිසිදු වන්නේ මිනිස් ක්‍රියාකාරකම් නිසා බව රූප රාමු භාවිතයෙන් කියා දෙන්න.
- තමා අවට පරිසරය පිළිවෙළකට සකසා ගැනීමට කළ හැකි දේවල් සිසුන්ගෙන් විමසන්න.

ක්‍රියාකාරකම 2

පියවර 1 :

- පන්තිකාමරය අපිළිවෙළකට හා අපිරිසිදුවට තිබෙන අවස්ථාවක් (ආහාර ගැනීමෙන් පසු, ක්‍රියාකාරකම් කිරීමෙන් අනතුරුව ආදී අවස්ථා) මේ සඳහා යොදා ගන්න.
- පන්ති කාමරය පිළිවෙළට සකස්කළ අවස්ථාවක් ප්‍රායෝගිකව අත්විඳීමට දෙන්න.
- පන්තිකාමර පරිසරයේ දැන් ස්වභාවය පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.

පියවර 2 :
- එස් 5 සංකල්පය අනුව

'සුපිපි අපි'
සුපසන්බව,
පිළිවෙළ,
පිරිසිදුකම,
අඛණ්ඩව පවත්වාගෙන යාම,
පිරිපුන් බව
නිරන්තරයෙන් කටයුතු කළ යුතු බව සිසුන්ට පහදා දෙන්න.

- පන්තිය පිළිවෙළට හා ලස්සනට තැබීමට කළ හැකි දේවල් මොනවා දැයි සිසුන්ගෙන් විමසන්න. මේ සඳහා පළමු වාරයේ පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේදී ලත් අද්දැකීම් ද යොදා ගන්න.
- ඒ අනුව පන්ති කාමරය සැකසීමට අවශ්‍ය දේවල් රැස් කර ගන්න.
- සිසුන් සියලු දෙනාගේ ම සහභාගීත්වයෙන් පන්ති කාමරය පිරිසිදු කිරීමට ක්‍රියාකාරකමක් සැලසුම් කරන්න

පියවර 3 :
- පිරිසිදුව හා පිළිවෙළට සැකසීමෙන් පසු පන්තිකාමරයේ ස්වභාවය පිළිබඳ සිසුන්ගෙන් විමසන්න. දිනපතා පිරිසිදුව හා පිළිවෙළකට පන්ති කාමර පරිසරය පවත්වා ගත යුතු බව සිසුන්ට පහදා දෙන්න.
- පුරුද්දක් වශයෙන් එය පවත්වා ගෙන යාමට යොමු කරන්න.
- තම නිවසේදී ද පිළිවෙළකට හා පිරිසිදු ව කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න

## ක්‍රියාකාරකම 3

පියවර 1
- ක්‍රියාකාරකම් පොතේ 'පන්තිය පිරිසිදු කරමු' පාඩම කියවන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.
- පන්ති කාමරය පිළිවෙළකට සැකසීමෙන් ලද අද්දැකීම් ද යොදා ගනිමින් 'පන්තිය පිරිසිදු කරමු' පාඩම තවදුරටත් සංවර්ධනය කරන්න.

**තක්සේරු නිර්ණායක**

| කාර්යසාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවයට පැමිණ ඇත | ප්‍රවීණතා මට්ටමෙන් දුරස්ථය |
|---|---|---|---|
| | | මට්ටම 2 | මට්ටම 1 |
| 8.1 තමා අවට පරිසරය පිරිසිදු කිරීමට දායක වෙයි. | 8.1.1<br>8.2.1 | තම පන්ති කාමරය පිළිවෙළකට සකසා ගැනීමට කළ හැකි දේවල් ප්‍රකාශ කරයි. | තම පන්ති කාමරය පිළිවෙළකට සකසා ගැනීමට කළ හැකි දේවල් ප්‍රකාශ කිරීමට අපහසුතා දක්වයි. |
| 8.2 නිතර ම අවට පරිසරය අලංකාර ව පිළිවෙළකට තබා ගැනීමට කටයුතු කරයි. | 8.2.2 | සාමූහිකව එකතු වී පන්තිය පිළිවෙළට හා ලස්සනට තබා ගන්නට ක්‍රියාකාරීව දායක වෙයි. | පන්තිය පිළිවෙළට හා ලස්සනට තබා ගන්නට උනන්දුවක් නොදක්වයි. |
| | 8.2.4 | පන්ති කාමරය පිරිසිදු කිරීමේ දී ලත් අද්දැකීමක් ප්‍රකාශ කරයි. | පන්ති කාමරය පිරිසිදු කිරීමේ දී ලත් අද්දැකීමක් ප්‍රකාශ කිරීමට අපහසුතා දක්වයි. |

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**
- තමා අවට පරිසරය පිරිසිදු කර අලංකාර ව පිළිවෙළකට තබා ගැනීමට කටයුතු කිරීම.

## සංකල්පය - පාරිසරික සංවේදීතාවය
## 5 පාඩම - පමණ දැන නෙළා ගමු

පරිසරයට ආදරය කිරීම උතුම් ගුණාංගයක් බව බුද්ධ දේශනාවේ සඳහන් වේ. සොබා දහමේ වටිනාකම අවබෝධ කරදෙමින් පරිසරය සුරැකිය යුතු බව වටහා දීම මෙයින් අපේක්ෂා කෙරේ.

**ඉගෙනුම් පල:**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 9.0 බුදුරජාණන් වහන්සේ සොබාදහමේ වටිනාකම ඉස්මතු කළ ආකාරය පිළිබඳව දැනුවත් වෙමින් ක්‍රියා කරයි. | පරිසර සම්පත් අරපිරිමැස්මෙන් භාවිතය | 9.2 පරිසර සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කළ යුතු බව දැන කටයුතු කරයි | 9.2.1 පරිසර සම්පත් අරපිරිමැස්මෙන් යුතුව භාවිත කිරීම |

**ඉගෙනුම් සම්පත්**
- ගීතය අඩංගු සංයුක්ත තැටියක්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**ක්‍රියාකාරකම 1**

පියවර 1
- සිසුන් සමග එළිමහනට ගොස් අවට ඇති මල් පිපුණු ගස්වැල් සහිත සුන්දර පරිසරය පිළිබඳ සාකච්ඡා කරන්න. (නැතහොත් එවැනි පරිසරයක් අඩංගු පින්තූර ඉදිරිපත් කරන්න.)
- සිසුන්ට අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙමින් පහත කරුණු තහවුරු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

  - ⋆ ගස්වල මල් පිපී තිබෙන විට පරිසරය ලස්සන වන බව
  - ⋆ මල්වල පැණි බීමෙන් සමහර සතුන් ජීවත් වෙන බව
  - ⋆ අපට මෙන් ම අන් අයට ද නෙළා ගන්නට ගසෙහි මල් ඉතිරි කළ යුතු බව
  - ⋆ සැදැහැ සිතින් මල් කිහිපයක් පූජා කළත් ලැබෙන පින අඩු නොවන බව

පියවර 2
- මේ කවිය ගායනා කරන්න. සුදුසු ආකාරයට අහන්නට සලස්වන්න.

**මේ ගසේ බොහෝ**
**පැණි දොඩම් තිබේ**
**පැහිල ඉදිල බිමට නැමිල**
**බර වෙලා අතු**
**නංගිටයි මටයි - ගෙඩි දෙකක් ඇතී**
**වැඩිය කඩන නරක ළමයි**
**හෙම නොවෙයි අපි**
**කෑම කා අපී**
**හොඳම හොඳ ගෙඩී**
**හොයල බලල කඩල ගනිමු**
**දෙක තුනක් ගෙඩී**

(උපුටා ගත් ග්‍රන්ථය : යු.ජී.පී.ද සිල්වා - මවුබස - සිංහල ඉගෙනුම් සම්පත් සංග්‍රහය)

- ඉහත කවිය ඇසුරෙන් අවශ්‍ය පමණට පරිසරයේ සම්පත් පරිහරණය කළ යුතු බව පුංචි අපේ මල් දන්සල පාඩමේ දී ගහට වැලට ඉතුරු කර මල් නෙළාගත් ආකාරය සිහිපත් කරමින් පහදා දෙන්න.

### ක්‍රියාකාරකම 2

පියවර 1

- බුදුපුදට මල් නෙළිය යුතු ආකාරය පිළිබඳව ක්‍රියාකාරකම් පොතේ දෙබස ඇසුරෙන් පැහැදිලි කර දෙන්න.
- අපේ බුදුහාමුදුරුවෝ ද පරිසරයට ආදරය කළ බවත්, පරිසරයේ ජීවත් වන සතුන්ට ද බාහෝ පිහිට වූ බවත් සිසුන්ට කියා දෙන්න.

**තක්සේරු නිර්ණායක**

| කාර්යසාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවයට පැමිණ ඇත | ප්‍රවීණතා මට්ටමෙන් දුරස්ථය |
|---|---|---|---|
| | | මට්ටම 2 | මට්ටම 1 |
| 9.2 පරිසර සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කළ යුතු බව දැන කටයුතු කරයි. | 9.2.1 | අරපිරිමැස්මෙන් යුතු ව දිනපතා බුදුපුදට මල් නෙළිය යුතු ආකාරය ප්‍රකාශ කරයි. | අරපිරිමැස්මෙන් යුතු ව දිනපතා බුදුපුදට මල් නෙළිය යුතු ආකාරය පැවසීමට දුෂ්කරතා පෙන්වයි. |
| | | පරිසර සම්පත් අරපිරිමැස්මෙන් යුතුව භාවිත කිරීමෙහි හැසිරීම් ප්‍රදර්ශනය කරයි. | පරිසර සම්පත් අරපිරිමැස්මෙන් යුතුව භාවිත කිරීමට උනන්දු නොවෙයි. |

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- අවශ්‍ය පමණට පරිසරයේ සම්පත් පරිහරණය කිරීම

## සංකල්පය - සතිමත්බව සෞඛ්‍යය හා යහපැවැත්ම
## 6 පාඩම - සුව දෙන දින චරියාව

හිතකර දෛනික ජීවිතයක් පවත්වා ගැනීමේ වැදගත්කම සිසුන්ට අවබෝධ කරවීම මෙයින් අපේක්ෂිත ය.

**ඉගෙනුම් පල:**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 10.0 හිතකර දෛනික චර්යාවක් සඳහා යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි. | දින චර්යාවක පිළිවෙළ | 10.1 යහපත් දින චරියාවක අනුපිළිවෙළ ප්‍රකාශ කරයි.<br>10.2 යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි. | 10.1.1 අනුපිළිවෙළ ප්‍රකාශ කිරීම.<br>10.2.1 යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම. |

**ඉගෙනුම් සම්පත්**
- දින චර්යාවක පිළිවෙළ ඉදිරිපත් කරන රූප රාමු හෝ වීඩියෝ දර්ශන
- පාන්දරින් නැගිටලා කවිය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

ක්‍රියාකාරකම 1

පියවර 1 :
- රූප රාමු හෝ වීඩියෝ දර්ශන යොදා ගනිමින් දින චර්යාවක පිළිවෙළ ඉදිරිපත් කරන්න.
- තමා දවස ගත කරන ආකාරය පන්තියට ඉදිරිපත් කිරීමට එක්, එක් සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- 'යහපත් දින චර්යාවක් ඇති ළමයකු වන්නට කැමති දැ'යි අසමින් තමන්ට ඇති එවැනි ගුණාංග පන්තිය ඉදිරියේ පැවසීමට අවස්ථාව දෙන්න.
- හොඳ බොදු දරුවකු වීමට තම දින චර්යාවේ කර ගත යුතු වෙනස්කම් පිළිවෙළට සිතීමට අවස්ථාව දෙන්න. අහඹු ලෙස කිහිපයක් විමසන්න.

පියවර 2 :
- සිසුන් සමග එක් ව පහත කවි ගායනා කරන්න. හැකි නම් ඇසෙන්නට සලස්වන්න.

**පාන්දරින් නැගිටලා**
**හීන් සුළඟෙ ඇවිදලා**
**යාන්තමට වෙහෙසිලා**
**මූණ සෝදමූ**
**කෑම ඉවර කර හෙමින්**
**හොඳ ඇඳුමින් සැරසෙමින්**
**පොත් ගෙන පාසල් බලා**
**ප්‍රීතියෙන් යමූ**
**අක්ක අයිය මල්ලිලා**
**එක්ක පාරෙ පේළි ලා**
**අයිනකින් පරිස්සමින්**
**ඉක්මනින් යමූ**
(එස්. මහින්ද හිමි)

- කවියේ ප්‍රකාශ වන අවස්ථා ඇතුළත් කර ගනිමින් පිළිවෙළකට දිනචරියාව ගත කළ හැකි ආකාරය පහදා දෙන්න.
- යහපත් දින චර්යාවක් ඇති විට අපට සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කළ හැකි වන ආකාරය පිළිබඳ පහත කරුණු ඇතුළත් වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

  - ★ උදෑසනින් අවදි වීම
  - ★ දත් මැද මුහුණ සෝදා ගැනීම
  - ★ නිවැරැදි ඉරියව්වෙන් තෙරුවන් වැඳීම
  - ★ නිවස, මිදුල පිරිසිදු කිරීම හා රැක බලා ගැනීම
  - ★ සිත් පහන් කරන සුදුසු වාදනයකට හුරු වීම
  - ★ නියමිත වේලාවට ආහාර ගැනීම
  - ★ නියමිත වේලාවට පාසල් යාම
  - ★ භාවනාවක යෙදීම
  - ★ විවේකය ඵලදායී ව ගත කිරීම
  - ★ නින්දට පෙර දත් මැද පිරිසිදු වීම

**ක්‍රියාකාරකම 2**

පියවර 2 :

- ක්‍රියාකාරකම් පොතේ 'සුව දෙන දින චර්යාව' පාඩම කියවන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.
- තමන්ගේ දින චර්යාවට අදාළ පින්තූර අඳින්නට සිසුන්ව යොමු කරන්න. ඒ ගැන කතාබහ කරන්න.

**තක්සේරු නිර්ණායක**

| කාර්යසාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවයට පැමිණ ඇත | ප්‍රවීණතා මට්ටමෙන් දුරස්ථය |
|---|---|---|---|
| | | මට්ටම 2 | මට්ටම 1 |
| 10.1 යහපත් දින චරියාවක අනුපිළිවෙළ ප්‍රකාශ කරයි. | 10.1.1 | යහපත් දින චරියාවක අංග ප්‍රකාශ කරයි. | යහපත් දින චරියාවක අංග ප්‍රකාශ කරන්නට අපහසුතා දක්වයි. |
| | | තමන්ගේ දින චරියාවට අදාළ අවස්ථාවක් චිත්‍රයට නගා එය විස්තර කරයි. | තමන්ගේ දින චරියාවට අදාළ අවස්ථාවක් චිත්‍රයට නගීමට අපහසුතා දක්වයි. |
| 10.2 යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි. | 10.2.1 | නිතර යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි. | නිතර යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය නොකරයි. |

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම

## සංකල්පය - සතිමත්බව සෞඛ්‍යය හා යහපැවැත්ම
## 7 පාඩම - පුංචි අපිත් මෙත් වඩමු

භාවනා කිරීමේ අරමුණ පහදා දී කුඩා කළ සිට ම සිසුන් මෛත්‍රී භාවනාවට යොමු කිරීම පිණිස තමාගේ පටන් තම සමීපතමයන් කෙරෙහි මෙත් වැඩීමට යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ.

**ඉගෙනුම් පල:**

| ඉගෙනුම් පල | අන්තර්ගතය | කාර්යසාධන ප්‍රමිති | නිර්ණායක |
|---|---|---|---|
| 12.0 සිත් පහන් කරන සරල භාවනාවක නිරත වෙයි. | මෙත් වඩමු | 12.1 මෛත්‍රී භාවනාවෙහි යෙදෙයි. | 12.1.1 නිවැරදි ඉරියව්වෙන් අසුන් ගැනීම<br>12.1.2 නිවැරදි පියවර අනුගමනය කරමින් භාවනා කිරීම |

**ඉගෙනුම් සම්පත්**

- 'මගේ සිත පිරිසිදුය පිරිසිදු ය පිරිසිදු ය' කවිය
- භාවනාව සඳහා අසුන් ගැනීමට අවශ්‍ය දේ

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**ක්‍රියාකාරකම 1**

පියවර 1

- නිදහස් පරිසරයකට සිසුන් කැඳවා ගෙන යන්න.
- පහසු අයුරින් අසුන් ගැනීමට සිසුන්ව යොමු කරන්න.
- සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කරමින්

  **'මගේ සිත පිරිසිදු ය පිරිසිදු ය පිරිසිදු ය**
  **මගේ සිත සන්සුන් ය සන්සුන් ය සන්සුන් ය**
  **මගේ සිත තැන්පත් ය තැන්පත් ය තැන්පත් ය**
  **මගේ සිත පිරිසිදු ය සන්සුන් ය තැන්පත් ය'**

  කවිය සිසුන්ට ඇසෙන්නට සළස්වන්න.

- දෑස් පියා ගෙන එයට සවන් දෙන්නට අවස්ථාව දෙන්න
- කිහිප වරක් මෙය සිදු කරන්න.

පියවර 2

- සිසුන් සියලු දෙනා ම සන්සුන් වූ පසු මෛත්‍රී භාවනාවෙහි නිරත වීමට දරුවන් යොමු කරන්න.
- මෙහිදී,
  - ⋆ භාවනාව සඳහා වාඩි වන ආකාරය
  - ⋆ දෑත් තබා ගන්නා ආකාරය ආදිය පිළිබඳ ව පිළිවෙළින් සිසුන්ට කියා දෙන්න.
- තමාගේ පටන් තම සමීපතමයන් තෙක් මෛත්‍රිය වැඩීම පිළිබඳ භාවනාවේ නිරත කරවන්න.
- මේ සඳහා ක්‍රියාකාරකම් පොතේ 'පුංචි අපිත් මෙත් වඩමු' පාඩමෙහි ඇතුළත් කොටස යොදා ගන්න.

**ක්‍රියාකාරකම 2**

**පියවර 1**

- දිනපතා සවසට හොඳින් පිරිසිදු වී නියමිත පරිදි සූදානම් ව බුද්ධ වන්දනාවේ යෙදීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.
- අනතුරුව මනස සන්සුන් වන සරල භාවනාවක යෙදීම අවශ්‍ය බව කියා දෙන්න.

**ක්‍රියාකාරකම 3**

**පියවර 1**

- ක්‍රියාකාරකම් පොතේ 'පුංචි අපිත් මෙත් වඩමු' පාඩම කියවන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ක්‍රියාකාරකම් පොතේ ක්‍රියාකාරකම සඳහා සිසුන්ව යොමු කරන්න.

**තක්සේරු නිර්ණායක**

| කාර්යසාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවයට පැමිණ ඇත | ප්‍රවීණතා මට්ටමෙන් දුරස්ථය |
|---|---|---|---|
| | | මට්ටම 2 | මට්ටම 1 |
| 11.3 මෛත්‍රී භාවනාවෙහි යෙදෙයි | 11.3.1 | මෛත්‍රී භාවනාව සඳහා නිවැරදි ව වාඩි වෙයි. | මෛත්‍රී භාවනාව සඳහා නිවැරදි ව වාඩි වීමට අපහසුතා දක්වයි. |
| | | නිවැරදි ව දෑත් තබා ගනියි. | නිවැරදි ව දෑත් තබා ගැනීමට උනන්දු නොවෙයි. |
| | 11.3.2 | නිවැරදි පියවර අනුව මෛත්‍රී භාවනාවෙහි යෙදෙයි. | නිවැරදි පියවර අනුව මෛත්‍රී භාවනාවෙහි යෙදීමට උනන්දු නොවෙයි. |

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දිනපතා මනස සන්සුන් වන සරල භාවනාවක යෙදීම

- 1 ශ්‍රේණියේ දී වර්ෂය පුරාවට සිසුන් අත්පත් කරගත් යහ ගුණ දම් මොනවාදැයි සිහිපත් කරමින් සාකච්ඡා කරන්න.
- 3 වන වාරය ක්‍රියාකාරකම් පොතේ අවසාන පිටුවේ ඇති ක්‍රියාකාරකම **"මා කළ හොඳ වැඩ කියමු; ලියමු"** සඳහා සිසුන් යොමු කරන්න.
- සිසු අදහස් අගය කරන්න.

බුද්ධ ධර්මය ගුරු මාර්ගෝපදේශය (සි)
1 ශ්‍රේණිය